# 2014 – 10 – 07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **06.** | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | ඩී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.40** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

## (01)

**01:01** **2014 – 09– 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2014 – 09– 02 දින මාසික සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2014 – 09 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## 2014 – 09– 04 දිනට අඩාලව කල් තබන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 09– 04 දිනට අඩාලව කල් තබන ලද මාසික සභා රැස්වීම් වාර්තාව කියවුවා සේ සලකා පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2014 – 09 – 04 දිනට අඩාලව පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන **නැත**

- **පෙ. ව. 09.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ.ඩබ්. හාෂිණී මෙන්නුකා විජේසූරිය මහත්මිය සභාවට පැමිණෙන ලදී.**

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** ' පුද්ගලික අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගාස්තු සංශෝධනය කිරීම ' මැයෙන් මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දැනට නගර සභා සීමාව තුළ පුද්ගලික අයදුම් කරුවන්ගේ අපද්‍රව්‍ය ඉවතට ප්‍රවාහනය කිරීම සඳහා වැට් රහිතව රු.500 ක ගාස්තුවක් අය කරන බවත් මේ සඳහා කම්කරුවන් 2 හෝ 3ක් සමග රියදුරකු සේවයේ යෙදවිය යුතු බවත් විශාල වියදමක් ඉන්ධන සඳහා වැය කළ යුතු බවත් ගොඩනැගිලි සුන් බුන් ඉවත් කිරීමේදී ඒ සඳහා අධික කාලයක් ගත වන බවත් එබැවින් අපද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා වන රු. 500.00 ක මුදල සංශෝධනය කරන ලෙස ඉල්ලා තිබුණි.

<u>මහජන සෞඛ්‍ය පරීෂකගේ උපදෙස් පරිදි වැඩ අධිකාරී විසින් සංශෝධනය කරන ලද නව මිල ගණන්</u>

01.<u>පස් හා ගොඩනැගිලි අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා</u>

ලෝඩ් 01 ක් සඳහා,

<u>කම්කරු ශ්‍රමය</u> -

| | |
|---|---|
| කම්කරුවන් ගණන | = 5 |
| එක් කම්කරුවකුට වැය වන පැය ගණන | = 2.5 |
| කම්කරු පැය ගණන | = 12.5 |
| පැයකට මුදල | = 52.00 |
| මුළු මුදල | = 650.00 |

ඉන්ධන -

| | |
|---|---|
| වැය වන ලීටර ගණන | = 4 |
| ලීටරයක මිල රු. | = 121.10 |
| මුළු මුදල | = 484.40 |
| | |
| යන්ත්‍ර සූත්‍ර ක්ෂයවීම් | = 100.00 |
| එකතුව | = 1234.40 |
| ලාභය 17% | = 209.84 |
| මුලු මුදල | = 1444.24 |
| | |
| ලෝඩ් 01 ක් සඳහා | = 1500.00 |

02. ගස් වල අතු හා අනෙක් ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා

ලෝඩ් 01 ක් සඳහා,

කම්කරු ශ්‍රමය -

| | |
|---|---|
| කම්කරුවන් ගණන | = 3 |
| එක් කම්කරුවකුට වැය වන පැය ගණන | = 2.5 |
| කම්කරු පැය ගණන | = 7.5 |
| පැයකට මුදල | = 52.00 |
| මුළු මුදල | = 390.00 |

ඉන්ධන -

| | |
|---|---|
| වැය වන ලීටර ගණන | = 4 |
| ලීටරයක මිල රු. | = 121.10 |
| මුළු මුදල | = 484.40 |
| | |
| යන්ත්‍ර සූත්‍ර ක්ෂයවීම් | = 100.00 |
| එකතුව | = 974.40 |
| ලාභය 17% | = 165.64 |
| මුලු මුදල | = 1140.04 |
| | |
| ලෝඩ් 01 ක් සඳහා | = 1200.00 |

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරිනියගෙන් වාර්තාවක් ලබා ගත්තා. එහිදී පස් හා ගොඩනැගිලි අපද්‍රව්‍ය ඉවත් කිරීමේදී ලෝඩ් එකක් රු. 1500.00 ක් ලෙසත් ගස් වල අතු හා අනෙකුත් ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා රු.1140.00 ක් වැය වෙනවා රු. 1200.00 අය කිරීමටත් මෙය ලබන වසරේ අයවැයේ සිට ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපි සෞඛ්‍ය අංශයෙන් මේ කටයුත්ත කරන්නේ.මේ වගේ අඩු මුදලකට අපි මේක කරන නිසා නගරේ ඉන්න සියලුම දෙනා ඇවිල්ලා මේකට සල්ලි බැදලා කුණු ටික අයින් කර ගන්නවා. ඉතින් අපට කුණු ඇදීමේ ගැටලුවකුත් මතු වෙනවා.එනිසා මෙය හොඳ යෝජනාවක්. අයවැයට පෙරම මෙය ක්‍රියාත්මක කරන්න පුලුවන් නම් හොඳයි කියලා හිතනවා.මොකද කුණු අදින්න සල්ලි බැදලා මේක කරන්න පරක්කු වුනාම අපට දොස් කියනවා. අපි මේ කටයුත්තට සේවකයෝ 4 දෙනයි රියදුරෙකුයි සුපර්වයිසර් කෙනෙකුයි යොදවන්න වෙනවා. මේක සභාවට ලොකු බරක්.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහිදී මම මතක් කරන්න ඕන අපි රු. 500.00 අයකලේ ගස් වල අතු කොළ කැපුවහම අයින් කරන්න.ඉතින් ගොඩනැගිලි ද්‍රව්‍ය කැඩුවහම මේ මුදල ප්‍රමාණවත් නෑ අනිවාර්යෙන්ම.වියදම් විශ්ලේෂණයක් කරලා තියෙනවා.මෙහිදි අපි එක ලෝඩ් එකක් අයින් කරන්න කම්කරු කුලිය විතරක් රු. 650.00ක් වැය කරනවා දැනටත්. එතකොට ඉන්ධන සඳහා රු 484.40 යි. යන්ත්‍ර සූත්‍ර ක්ෂයවීම් සඳමහා රු 100.00 . ඒ අනුව අපි දැනුත් රු. 500.00 අය කරලා අදින ලොඩ් එකක් සඳහා රු. 1234.40 වැය කරනවා. ඉතින් මේච්චර කල් අපට ලෝඩ් 100ක් ආවනම් ඒකෙන් 95ක් ම ගොඩනැගිලි ද්‍රව්‍ය. ඉතින් ගාස්තු සංශෝධනය කරන එක හොඳයි. මේකේ අපේ කලින් සභා තීරණය තිබුණේ අඩක් සේවකයින්ට ලබා දෙන්න.නමුත් රු. 500.00 න් රු.250.00 ක් ගන්න සේවකයෝ ඉදිරිපත් නොවන නිසා ඇත්තටම මෙම සේවාව පවත්වාගෙන ගියේ අතිකාල ලබා දීම් යටතේ. ඉතින් ඒකෙන් සභාව විශාල පාඩුවක් ලැබුවා. ඉතින් කාලානුරූපීව මෙය වෙනස් කිරීම හොඳයි. මේක ලබන අයවැයේ සිට ක්‍රියාත්මක කිරීම සුදුසුයි. මොකද තව මාස කීපයයිනේ තියෙන්නේ.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පුද්ගලික අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සංශෝධිත ගාස්තු 2015 වසරට අදාල අය වැය ලේඛනය මගින් සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3:2 යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ඉදිරිපත් කරන ලදි.

3:3 **'තාක්ෂණ ඇගයීම් වාර්තාව ලබා ගැනිම සම්බන්ධවයි'** මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

අම්බලන්ගොඩ නගර සභාවට අයත් කාය වර්ධන මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිළදී ගැනිම සම්බන්ධ ඇගයීම් කමිටුවට සම්බන්ධ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු හා ගාල්ල ක්‍රීඩා අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරී විසින් දුරකථනයෙන් කථා කර දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණු කරු ආර්. නිරෝෂ මහතාව මෙම ඇගයීම් කමිටුවට සම්බන්ධ කර ගන්නා ලෙස උපදෙස් ලබා දුන් බවත් ඒ අනුව මෙම නිළධාරී මහතාට ඇගයීම් කමිටුවට සම්බන්ධ ලිපි යොමු කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ නගර සභාවට අයත් කාය වර්ධන මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ ඇගයීම් කමිටුවට දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණු කරු ආර්. නිරෝෂ මහතාව සම්බන්ධ කර ගැනිම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

3:4 යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ඉදිරිපත් කරන ලදි.

3.5 ‘ පැරණි ගී මිහිර 08 - 2014.10.11 නොමිලයේ බැනරයක් ප්‍රදර්ශනය කිරීම ’ මැයෙන් අම්බලන්ගොඩ දේවානන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සම ලේකම් ඉරේෂ් රොෂාන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය වාර්ෂිකව සංවිධානය කරනු ලබන පැරණි ගී මිහිර 08 ප්‍රසංගය 2014.10.11 වන දින ප. ව. 6.00 විදුහල් පරිශ්‍රයේදී පැවැත්වෙන බවත් එයට අදාල ප්‍රචාරනය සම්බන්ධ ප්‍රධාන දැන්වීම් පුවරුව අම්බලන්ගොඩ බස් නැවතුම්පල ඉදිරිපිට අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පැරණි ගී මිහිර 08 ප්‍රසංගයේ ප්‍රධාන දැන්වීම් පුවරුව අම්බලන්ගොඩ බස් නැවතුම්පල ඉදිරිපිට අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි .**

3.6 ‘ පෙස්ට්ගාඩ් ලබා ගැනිම සඳහා ’ මැයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එවා තිබූ ලිපිය සභාගතකරන ලදි.
කසල අවසන් බැහැරලන ස්ථානයේ මැස්සන්ගෙන් ප්‍රදේශවාසීන් ආරක්ෂා කර ගැනිම සඳහා පෙස්ගාඩ් කෘමිනාශක ලිටර 03ක් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් පෙස්ගාඩ් කෘමිනාශක ලිටර 03ක් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි .**

**3:7** ‘ පුහුණු වැඩ සටහනක් පැවැත්වීමට නොමිලයේ ක්‍රීඩාගාරය ලබා ගැනිම ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන්ගේ සහයෝගිතාවය හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා බැහැරගත ක්‍රියාකාරකම් ඇතුලත් පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අවශ්‍ය බවත් ඒ සඳහා 2014.10 වන මස 13,15,16,17 යන දිනයන් සඳහා නගර සභා ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් 2014.10 වන මස 13,15,16,17 යන දිනයන් සඳහා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ සටහන වෙනුවෙන් නගර සභා ක්‍රීඩාංගනය නොමිලේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි .**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා:**

5:1:1 ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් අම්බලන්ගොඩ නගරයේ දියුණුව වෙනුවෙන් අම්බලන්ගොඩ පැරණි වෙළද සංකීර්ණය අලුතින් ඉදිකිරීම සදහා ලක්ෂ 500 ක් සහ අම්බලන්ගොඩ අනාගත දරුවන් වෙනුවෙන් නව පුස්තකාලයක් ඉදිකිරීමට මුදල් ප්‍රතිපාදන ලබා දීම වෙනුවෙන් ස්තුතිය පුද කළ යුතු යැයි යෝජනා කර සිටිමි

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමණි ඇත්තටම අපට විශාල අඩුපාඩුවක් වෙලා තිබ්බ හැමදාමත් කතා කරන අපේ පරණ මාර්කට් එක නිසා මේ නගරයේ විශාල තද බදයක් නිර්මාණය වෙලා තියෙනවා . අනාගතයේද මෙය තවත් වැඩි වේවි.මෙවන් අවස්ථාවක එතුමා අපිව කැදවලා නගරයට මොනවද අවශ්‍ය කරන්නේ කියලා අපෙන් ඇහුවා. එහිදි අපි ප්‍රකාශ කලා අම්බලන්ගොඩ මාර්කට් එක හදන්න අපට මුදල් ලබා දෙන්න කියලා. එහිදි එතුමා ලක්ෂ 500ක් ලබා දුන්නා.ඒ වගේම ගරු සභාපතිතුමා ඉල්ලීමක් කළා අනාගත දරුවන් වෙනුවෙන් නව පුස්තකාලයක් හල් වතුර ප්‍රදේශයේ ඉදි කරන්න මුදල් ලබා දෙන්න කියලා. ඉතින් එතුමා අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් මෙම කාර්යයන් දෙකටම මුදල් ලබා දුන්නා.ඉතින් මේ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ සමස්ථ ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් විදියට අපි මේ සම්බන්ධයෙන් අපගේ ස්තුතිය හා ගෞරවය පුදකරන්න මේක අවස්ථාවක් කරගන්නවා.අපි දන්නවා පාලක පක්ෂයේ අපෙත් විපක්ෂයේත් දැඩි ඉල්ලීමක් තිබුණා මේ අම්බලන්ගොඩ පරණ වෙළද සංකීර්ණය කඩා ඉවත් කර නවීන ආකාරයට ගැලපෙන ආකාරයෙන් සාප්පු සංකීර්ණයක් ඉදි කරන්න කියලා.අපි එතුමාට ස්තුති කරන්න ඕන මොකද අපේ ඉල්ලීමට එතුමා කන් දුන්නේ.අපට ඇහුන් කන් දුන්නා කියන්නේ අම්බලන්ගොඩ සමස්ථ ජනතාවටම ඇහුන් කන් දුන්නා කියන එක.එනිසා එතුමාට අපේ ගෞරවය පුදකර සිටින්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි අම්බලන්ගොඩ නගරයට විශාල අඩු පාඩුවක් වෙච්ච පොදු වෙළද පොල ප්‍රතිසංස්කරණය කිරීම අපි හැමදාම කතා කරන දෙයක් මෙය ප්‍රතිසංස්කරනය කරන්නේ කෙහෙමෙද කියන එක. සුනාමියටත් මේක ගොදුරු වුණා.දැන් මෙහිදි අපි යෝජනා කරලා තියෙන්නේ අම්බලන්ගොඩ පොදු වෙළද පොල සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කර විශාල ගැටලුවක්ව පවතින පොදු වෙළදපල පාර්කින් එකක් යට තට්ටුවේ ඉදිකරලා මහවිදියට සමාන්තරව පොදු වෙළද පොල නැවත ප්‍රතිවුහගත කරන්න තමයි අපේ අදහස තියෙන්නේ. මෙම කටයුත්තේදි අපි විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුති කරනවා වගේම අතිගරු ජනාධිපතිතුමාටත් ස්තුතිකරන්න ඕන. දැයට කිරුළ වැඩසටහන යටතේ තමයි මෙය සිදුකරන්නේ අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා යටතේ. මේ අනුව ලැබෙන මුදල නිවරදිව භාවිතාකරලා අපි මේ අඩු පාඩු සකස්කරගන්න අපි මුල ඉදලම මැදිහත් වෙලා කටයුතු කරන්න ඕන.ඊයේ දිනයේද අපි මේ මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ආසනයේ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයම කැදවලා සාකච්ඡාවක් කළා. ඒ වගේම අපේ තවත් ඉල්ලීමක් තමයි අම්බලන්ගොඩ නගරයේ තියෙන ප්‍රධාන පුස්තකාලයේ දැනට පොත් 30000 ක් 35000 ක් විතර තියෙනවා. නමුත් ඒ වගේ පොත් ගාණක් තිබ්බත් අපට පොත් තියන්න විතරයි ඉඩ තියෙන්නේ. කියවන්න කරන්න තියෙන ඉඩ ප්‍රමාණය අඩු වෙමින් යනවා.එනිසා විශාල මහජන පුස්තකාලයක් ප්‍රතිවුහගත කිරීමේ අවශ්‍යතාවයක් මතුවෙලා තියෙනවා. මේ

සම්බන්ධයෙන් අපි කලිනුත් සැලසුමක් සකස් කළා මොරටුව විශ්ව විද්‍යාලය සහ ජර්මනියේ ජර්මන් කැතේ ඉන්ස්ටිටියුට් ආයතනයත් ජපානයේ තියෙන අපේ ජපන් එම්බසිය හරහා ලබා දුන්න සහයෝගය හරහාත්. ඒ සැලසුම අනුව හල්වතුර භූමිය තමයි එදත් අපි පෙන්වා දුන්නේ. එම ස්ථානයේ යම් නිස්කලංකභාවයක් තියෙනවා මේ ස්ථානයටත් වඩා. ඒ වගේම කියන්න ඕන අද විශාල ගැටලුවක් වෙලා තියෙන පුංචි පොළ වගේ පොළවල් ස්ථාන ගත කිරීම. මෙමගින් අපි සියලුම අවහිරතා මගහැරගන්න බලාපොරොත්තු වෙනවා. දැයට කිරුළ වැඩසටහන යටතේම යෝජනා වෙච්ච දෙයක් තමයි අම්බලන්ගොඩ පැරණි චිචින් මධ්‍යස්ථානයේ සුපිරි වෙළඳ සැලක් සමුපකාරය මගින් හො 'බදු දීම මගින් හෝ ඉදිකරලා එමගින් අම්බලන්ගොඩ අත්‍යාවශ්‍ය කටයුත්තක් ලෙස සැලකෙන මෙම කටයුත්ත සමුපකාරයට භාර දෙන්න කියලා මේ යෝජනා 3 අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් අපි ඉදිරිපත් කරලා තියෙනවා. දැයට කිරුළ වැඩ සටහනෙන් මේ සුවිශාල මුදල අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් ලැබෙනවා. මෙයට සමගාමීව අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවට බද්දේගම ප්‍රාදේශීය සභාවේ කොටසකටත් මේ මුදල සම්පූර්ණයෙන් ලැබිලා තියෙනවා. ඒ වගේම දැනටත් මේ වසරේ සහ ලබන වසරේ මුල් කාලවලත් භාවිතා කරන්න ලැබිච්ච මුදල බැලුවහම මිලියන 800 ට වැඩි ප්‍රමාණයක් වෙනවා රජය මගින් මෙම ආසනය සඳහා ලබා දීපු මුදල.අපට දැන් කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීමේ ගැටලුවකුත් මතු වෙලා තියෙනවා. මොකද මේ තරම් විශාල වැඩ කොටසක් එකවර ආපුවහම කරගැනීමේ ගැටලුවක් මතුවෙනවා. මොකද අද තියෙන තත්වය අනුව කොන්ත්‍රාත්කරුවනුත් විශාල වශයෙන් වැඩ අරගෙන තියෙනවා.අපි ස්තුතිවන්ත වෙනවා මේ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන ඇමතිතුමාට මොකද එතුම ාසිය කැමැත්ත අනුව මේ මුදල වෙන් කිරීමේ හැකියාව තිබුණත් අපේ අදහස් විමසීලා මේ මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන්.ඒ වගේම අපේ යුතුකම තමයි මේ මුදල 100% පරිභෝජනය කරගන්න එක. මොකද ආපු මුදල් නැවත හැරිලා ගියොත් අපට ඇත්තටම වෙන්නේ අවාසියක්. මොකද අම්බලන්ගොඩ මේ මාර්කට් එක හදලා තියෙන්නේ දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණයක් ලබාගෙන. නමුත් ඒ වගේ නෙවෙයි ප්‍රධානයක් වශයෙන් ලැබෙන ප්‍රතම අවස්ථාව මේක. අපි මෙහිදී මූලික සාකච්ඡාවක් කරන්න ඕන මොකද ඉන්න වෙලෙන්දෝ සියලු දෙනාම ආරක්ෂාකර ගන්න ඕන.කොහොමද මොවුන් ස්ථානගත කරන්නේ සහ මොවුන්ට පහසුකම් සලසන්නේ කියන එක අපි සාකච්ජා කරන්න ඕන.එනිසා අපි අතිගරු ජනාධිපතිතුමාටත් මෙම වැඩ සටහන මෙහෙය වන රංජිත් සියඹලා පිටිය මැතිතුමාටත් ඒ වගේම අපේ අදහස් විමසීම සම්බන්ධයෙන් ගරු ප්‍රධාන ඇමතිතුමාටත් මේ අවස්ථාවේ අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා.

- පෙ. ව.10.13 පමණ ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා මුලාසනයෙන් මදකට ඉවත්ව ගිය අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා මූලාසනයට පැමිණෙන ලදී.

- පෙ. ව. 10.14 ට පමණ ගරු නගර සභා  මන්ත්‍ර ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

මම හිතන්නේ අද අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනය සම්බන්ධයෙන් බලන කොට ඓතිහාසික දිනයක් ලෙස සලකන්න පුලුවන්. මක්නිසාද යත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අම්බලන්ගොඩ ප්‍රධාන සංවිධායක දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් මැතිතුමා අපට මේ ලබා දීපු තිළිණය අපේ සහෝදරත්වයෙන් ස්තුතිපූර්වකව අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් අපි භාර ගන්නා. මක් නිසාද යත් සංවර්ධන කටයුතු වෙනුවෙන් අම්බලන්ගොඩ නගරයට මෑත ඉතිහාසයේදි ලැබුණ මූල්‍ය ප්‍රතිපාදන අපි ඉදිරි අනාගතය වෙනුවෙනුත් නැවත නැවතත් සිහිකරමින් ස්තුතිවන්ත වෙනවා. අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා මීට මාස 6- 7ට පෙර ලක්ෂ 3000 ට නොඅඩු ප්‍රමාණයක් ලබා දුන්නා. ඊට පරිභාහිරව තමයි අපේ මේ ආදරණීය නායකත්වය අපේ අදහස් විමසමින් මේ මුදල ලබා දුන්නේ. අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනය වෙනුවෙන් විශාල මුදලක් ලබා දීලා ඊට මාස ‍ෙක් ඉක්මයාමට පෙර ඊට වඩා විශාල මුදලක් ලබා දීම

සම්බන්ධයෙන් අපි ඉතාමත් අගය කොට සලකනවා. අම්බලන්ගොඩ බුද්ධිමතුන්ගේ පාරාදීසය බැබළවීමට සහ ඉදිරියට ගෙන යාමට නව පුස්තකාලයක් ඉදිකිරීමේ අරමුණින් ප්‍රතිපාදන වෙන් කිරීමත් එහි සීමාවක් සදහන් නොකර සැලසුම් සහගත ඉදිකිරීමක් වෙනුවෙන් අවශ්‍යදායකත්වය එතුමා ලබා දුන්නා. ඊට පරිබාහිරව අම්බලන්ගොඩ නගරයේ වෙළද වටිනාකම වැඩි කිරීමට අම්බලන්ගොඩ සමුපකාර සමිතියට අයිති ස්ථානයේ නැවත සුපිරි වෙළද සැලක් ඉදිකර එය පවත්වා ගෙන යාම සදහා පෞද්ගලික අංශයත් දායක කරගෙන එතුමාගේ දායකත්වය නොමදව ලබා දීම පිළිබඳව අපි ස්තුතිය පුදකර සිටිනවා. අම්බලන්ගොඩ නගරය කේන්ද්‍රකොට ගෙන අම්බලන්ගොඩ නගරය පුරාම උදාහරණයක් ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාශයේ ක්‍රීඩා පිටි ශ්‍රවණාගාර උද්‍යාන සහ මං මාවත් ඉදිකිරීම සම්බන්ධ ඊයේ දිනයේදී අපි කළ සාකච්ඡා මල් ඵල ගන්වමින් අපේ ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ලක්ෂ 7000 -8000 ට නොඅඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීම සම්බන්ධයෙන් ගරු ප්‍රධාන ඇමතිතුමාට නැවත නැවතත් අපි ස්තුතිය පුදකර සිටිනවා අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන්. ඊට අමතරව ගරු සභාපතිතුමණි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත 2016 දී ආසියාවේ ආශ්චර්ය කරා ලංකාව ගෙනි යන ගමනේ දී එහි අභිමානවත් පුරවරය ලෙස අම්බලන්ගොඩ නගරය කල එලි දැක්වීමට අවස්ථාවක් සලසාදීම පිළිබඳ අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙමින් ඊටත් අමතරව දැයට කිරුළ වැඩ සටහනේ සියලුම කටයුතු මෙහෙය වන ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාටත් අපේ ස්තුතිය පුදකර සිටිනවා මේ අවස්ථාවේ.

- පෙ. ව.10.21 පමණ ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා නැවතත් මුලාසනයට පැමිණෙන ලදී.

- **පෙ. ව. 10.22 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමණියගේ මහතා සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අද දින අපි විශේෂ යෝජනාව ලෙස ගෙන ආ මේ සංවර්ධන යෝජනාව දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල්ද සිල්වා මැතිතුමා අම්බලන්ගොඩ ආසනය සම්බන්ධයෙන් වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ස්තුති කිරීමේදී පළමුවම අතිගරු ජනාධිපතිතුමාට ස්තුති කළ යුතුයි.මොකද දැයට කිරුළ වැඩසටහනට සමගාමීවයි අම්බලන්ගොඩ ආසනයට මෙම ප්‍රතිපාදන ලබා දුන්නේ. අපට මතකයි ඉතිහාසයේ දවසක ගම් උදාව වැනි ප්‍රදර්ශන රාජ්‍ය අනුග්‍රහයෙන් තිබ්බා. ඒ ගම් උදාව වැනි වැඩසටහන් වලදී ආසන 1 හෝ 2ක් තමයි සංවර්ධනය වුණේ. නමුත් මේ දැයට කිරුළ වැනි කර්තව්‍යයේදී දකුණු පළාත පුරාවටම ඒ ඒ ප්‍රදේශ වල යම් යම් සංවර්ධන කටයුතු සදහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා අම්බලන්ගොඩ නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ ගරු සභාපතිතුමාගේ ඒකමත්ක ඉල්ලීම පරිදි අභාවයට ගිය අම්බලන්ගොඩ පොදු වෙළද පොල සංවර්ධනය කිරීමේදී එතුමා මුලින්ම අපෙන් විමසා සිටියා කුමන මුදලක් අවශ්‍ය වෙනවද කියලා.අපේ දැණුම් ප්‍රකාරව අපි කීවා මිලියන 500ක මුදලක් අපට ලබා දෙන්න කියලා. එතුමා නොපැකිලිව එය ලබලා දුන්නා. මෙසා විශාල මුදල් ප්‍රමාණයක් අම්බලන්ගොඩ නගර සභාවට ඉතිහාසයේ කිසිම දවසක කිසිම සංවිධායක වරයෙකු හෝ ඇමතිවරයෙකු ලබලා දීලා නෑ. අපට ලැබුණ නම් ලැබිලා තියෙන්නේ ණය මුදල් විදියට. කෙලින්ම මෙසා විශාල මුදල් ප්‍රමාණයක් ලබලා දීපු ප්‍රථම අවස්ථාව මෙය. ඒ වගේම අම්බලන්ගොඩ ආසනයට ගමනැගුම දිවි නැගුම වැනි වැඩසටහන් යටතේ ලක්ෂ 3300 ක මුදල් ප්‍රමාණයක් වෙන් කලාට පසුවයි මේ ප්‍රතිපාදන ලැබෙන්නේ. ඒ මුදල් පෙරදී අපි සභාවෙදි ඉදිරිපත් කළා. අම්බලන්ගොඩ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමට ලක්ෂ 120 යි. පොල්වත්ත රෝහල සදහා ලක්ෂ 150 කට නොඅඩු මුදලක් නගරයේ පාරවල් 12 සහ මං මාවත් සදහා වෙන් කළ සියලුම මුදල් වල එකතුව ලක්ෂ 700 - 800ක් වන මුදලක් මේ වසරේදී රජයෙන් ලබා දීලා තියෙනවා. ඊට අමතරවයි නගර සභා පොදු වෙළද පොල සදහා මෙම මුදල් ලබා දුන්නේ. අපි මන්ත්‍රීවරුන් විදියට මේ නිළධාරීන් නිසියාකාරව මෙහෙයවලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ කටයුතු ඉටු කර ගන්න ඕන. මොකද මේ මුදල් ලැබිලා තියෙන්නේ අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන්. එනිසා අපි විපක්ෂේ මන්ත්‍රීවරුන්ගෙනුත් ඉල්ලනවා මේ දිහා උපේක්ෂාවෙන් බලලා මේ දේට දායකත්වය ලබලා දෙන්න කියලා.ගරු සභාපතිතුමණි මේ වෙළද සංකීර්ණය වැසිලා අවසන් අවස්ථාවට පත් වෙන විට මේ නගරය අකර්මන්‍ය වෙනවා. මහ විදියේ සියලුම වෙදළ හිමියන් මේවා ස්ටෝරු විදියට පවත්වාගෙන යන තත්වයක් තුළ ගරු ප්‍රධාන ඇමතිතුමා ප්‍රකාශ කළා සැහෙන කාලයක ඉදලා මේ පොදු වෙළද පොල ගොඩනැගිල්ල නවීකරණය කිරීම මගේ ඔලුවේ තිබුණා.මෙවැනි මුදල් ප්‍රමාණයක් පළාත් සභාව තුළින් වෙන් කර ගැනීමේ හැකියාවක් තිබුණේ නෑ පැවති මුදල් ප්‍රතිපාදන අනුව නමුත් මම මේ අවස්ථාවෙදි නොපැකිලිව මේ මුදල් වෙන් කරනවා කියලා. ඉතින් මම හිතන්නේ අපි එතුමාට සුවිශේෂී කෘතඥාවක් ස්තුතියක් මේ වෙනුවෙන් පල කළ යුතුයි. මුදල් ලැබුණහම නගරයේ ජනතාවට අවශ්‍ය පොදු වෙළද පොල එළවලු ටික මාලු ටික එකම ස්ථානයකින් ගන්න පුලුවන් ආකාරයට වෙලදුන් ඒකරාශී කරලා ලස්සන පොදු වෙළද පොලක් නිර්මාණය කරලා නගරයේ ජනතාවට එය ලබලා දෙන්න හැකියා ලැබෙනවා කියන විශ්වාසය තබමින් ගරු ඇමතිතුමාට නැවත වතාවක් ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපගේ මේ විශේෂ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් දක්වපු සහයෝගයට ස්තුතිවන්ත වෙනවා. මොකද එතුමා වෙනත් යෝජනා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වෙද්දි තමයි අපි මන්ත්‍රීවරුන්ගේ මේ යෝජනාවට එකග වුණේ. ඉතින් අපි එතුමාට ස්තුතිය පල නොකලොත් එය කනගාටුවට කරුණක් වෙනවා. මෙහිදි අපි පාලක පක්ෂය වුනත් විපක්ෂයටත් දැඩි වුවමනාවක් තිබුණා මෙය නවීකරණය කරන්න.දැන් මෙය කඩා ඉවත් කරලා නව ගොඩනැගිල්ලක් ඉදි කරන්න පුලුවන් . එනිසා සරත් මන්ත්‍රීතුමා සදහන් කළ ආකාරයට අපි සියලුම මන්ත්‍රීවරු එකතුවෙලා මේ මුදල යොදවන්නට සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ යෝජනාවට විපක්ෂ අය ඉන්නවද? එසේනම් මෙම ස්තුති කිරීමේ යෝජනාවේ පිටපතක් එතුමාට යවන්න.

**ඉහත සදහන් යෝජනාව පිළිගත යුතු බවට ගරු උප සභාපති  කමල් වැල්ලගේ  මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජ් . ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**
**ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා අම්බලන්ගොඩ පැරණි වෙළද සංකීර්ණය අලුතින් ඉදිකිරීම සදහා ලක්ෂ 500 ක් සහ අම්බලන්ගොඩ අනාගත දරුවන් වෙනුවෙන් නව පුස්තකාලයක් ඉදිකිරීමට මුදල් ප්‍රතිපාදන ලබා දීම වෙනුවෙන් ස්තුතිය පුද කළ යුතු යැයි කරන ලද යෝජනාවේ පිටපතක් ගරු ප්‍රධාන ඇමතිතුමාට යැවීමට සභාව තීරණය කරන ලදී.**

- **පෙ. ව. 10.30 ට පමණ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා සභාවේන් පිටව යන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමණි ටෙන්ඩර් පෙට්ටිය අපි සදහන් කලාටත් පස්සේත් එහෙමමමයි තියෙන්නේ. කණගාටුයි අපට ඒ පිළිබඳව.කොලයක්වත් අලවලා කවුරු හරි අත්සන් කරන්න ඕන.ඒක තමයි නීතිය.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පෙන්නන්න බලන්න.මම අලවන්නෑනේ ඕක.ලේකම්තුමා විපක්ෂ නායකතුමා කියන මේ කාරණා ඇත්ත. ඒ ආකාරයට කටයුතු කරන්න.අද දින ටෙන්ඩර් සියල්ලක්ම අවලංගු කරනවා. නැවත විශේෂ සභාවක් කැදවනවා මේ මාසේ මැද. ඒ සදහා නැවත ටෙන්ඩර් ටෙන්ඩර් කැදවන්න.ලේකම් මහත්මයා මේ සදහන් කරන ආකාරයට කටයුතු කරන්න. කිසිම වැරදි ආකාරයේ සැකයක් ඇති වන ආකාරයට කටයුතු සිද්ධවෙන්න ඉඩ තියන්න එපා. මේ තත්වය නිසා ටෙන්ඩර් මණ්ඩලයක් පත් කරන එක තමයි හොද. ටෙන්ඩර් මන්ඩලයක් තිබුණා අපේ සියලුම මන්ත්‍රීවරු නියෝජනය වන ආකාරයට. නැවත ටෙන්ඩර් මණ්ඩලයක් පත් කරනව නම් හොදයි.

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා :**

5:2:1 "2014 අයවැය ලේඛනය වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමට" මැයෙන් ගිණුම් තබන නිළධාරී විසින් ඉදිරිපත් කර තිබු පරිපාලන යෝජනාව සභාගත කරන ලදි.

2014 අයවැය ලේඛනයට අදාලව ප්‍රතිපාදන ඉක්මවා ඇති වියදම් වැය ශීර්ෂ වෙනුවෙන් වෙනත් වැය ශීර්ෂයකින් මුදල් මාරු කර ගැනීමට යෝජනා කර ඒ සදහා අනුමැතිය ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහි මුදල් රෙගුලාසි 66 යටතේ වැය ශීර්ෂ 11471 සහනාධාර දුම්රිය නිවාඩු බලපත්‍ර 2014 දි ඇස්තමේන්තුව 5000.00 යි. නමුත් සත්‍ය වියදම දැනට 4765.00. ඉතිරිය තියෙන්නේ රු.235.00. ඒ අනුව වැය මාරු කිරීම සදහා

11479 වෙනත් කරුණු යටතේ ඇස්තමේන්තු රු. 10000.00 ක් තියෙනවා. ඒකෙන් රු. 5000.00 ක් මාරු කිරීමට යෝජනා කරලා අනුමැතිය ඉල්ලනවා. ඊලගට වැය ශීර්ෂ 12459 - iv යටතේ දේශීය ආදායම් වැට් බදු ඇස්තමේන්තුව ලක්ෂ 10යි. දැනට 2014.07.31 දිනට වැට් සදහා ගෙවපු මුදල 1046573.73 යි. ඒ අනුව දැනට වැඩි පුර වියදම් කරලා තියෙනවා දැනට රු.46573.73 ක්. ඒ අනුව මෙහිදී ප්‍රතිපාදන මාරු කිරීම 12459 -i යටතේ විගණන ගාස්තු වශයෙන් ලක්ෂ 7ක් වෙන් කරලා තියෙනවා. මෙහිදි ලක්ෂ 7 ම මාරු කිරීමට අනුමැතිය ඉල්ලා සිටිනවා. ඊලගට 12459 -vi ජාතිය ගොඩනැගීමේ බද්ධ රු. 500.00 යි.2014.07.31 දිනට සත්‍ය වියදම රු.4580.99 යි. ඒ අනුව වැඩි පුර වියදම් වෙලා තියෙනවා රු. 3580.99 ක්. ප්‍රතිපාදන මාරු කිරීමට යෝජිත වැය ශීර්ෂය සංග්‍රහ කටයුතු 12459 යටතේ 15000.00 යි. ඉන් රු. 1000.00 ක් මාරු කිරීමට අනුමැතිය ඉල්ලා සිටිනවා. තවද 33412 අතිකාල දීමනා සහ නිවාඩු වැටුප් වැය ශීර්ෂය ඇස්තමේන්තුව 400000.00 යි. දැනට අතිකාල දීමනා සහ නිවාඩු වැටුප් සදහා 2014.07.31 දිනට රු. 565631.13 සත්‍ය වියදම. ඒ අනුව අතිරේකව වියදම් වෙලා තියෙනවා 165631.13ක්. මේ සදහා ප්‍රතිපාදන මාරු කිරීමට 33411 වැටුප් හා වේතන සහ 33419 වෙනත් භාෂා දීමනාව ඇතුලුව. එහි වැටුප් හා වේතන 2014 ඇස්තමේන්තුව රු.7572000.00 යි. වෙනත් හී ඇස්තමේන්තුව රු. 438000.00 යි. වැටුප් හා වේතන සදහා 2014 වියදම් වෙලා තියෙන්නේ රු. 3818588.65 යි. ඒ අනුව එයින් ලක්ෂ 3 ක් මාරු කිරීමට අනුමැතිය ඉල්ලා සිටිනවා. වෙනත් දීමනාවලින් 360000.00ක් මාරු කිරීමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**ඉහත සදහන් යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච් . එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

5:2:2" 2015 වර්ෂය සදහා බදු මුදල් ගැසට් පත්‍රයේ පලකිරීම "මැයෙන් ප්‍රධාන ආදයම් කළමනාකාර සහකාර විසින් ඉදිරිපත් කර තිබු පරිපාලන යෝජනාව සභාගත කරන ලදී.

2015 වර්ෂයට අදාල වරිපනම් බදු ගෙවීම, 2015 වර්ෂයට බලපත්‍ර ගාස්තු හා බදු පැනවීම සදහා නගර සභා ආඥා පනතේ 162 ,164(1),162(ආ),165(ආ iii),වගන්ති වලට අදාලව උප ලේඛන අංක 01,08,03,04,05,06 පරිදි බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු, ඉඩම් විකිණීම මත 01% බදු අයකිරීම,රථවාහන හා සත්ව බදු ,නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන වෙළද ව්‍යාපාර සහ කර්මාන්ත වලින් පනවා ඇති බදු අය කිරීම යන නිවේදන සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ගැසට් පත්‍රයේ පල කිරීමට යෝජනා කර ඒ සදහා අනුමැතිය ඉල්ලා තිබුණි.

**ඉහත සදහන් යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ . ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝදතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අපේ සභාවේ පරිපාලන වශයෙන් ඔබතුමා ලබා දෙන සහ සභාව පවත්වාගෙන යන ආකාරයේ සෑහෙන දුරට විශමතා තියෙනවා.ඔබතුමා විසින් ගිය සභාවෙදි ප්‍රකාශ කර සිටියා මේ මහ අම්බලන්ගොඩ සිද්ධිය සම්බන්ධයෙන් ඒ දේ පවා ඔබතුමාගේ නියෝගය මත න්‍යාය පත්‍රයට ඇතුලත් වෙලා නෑ. මෙය කනගාටු දායක දෙයක් .මිනිස්සුත් අසරණ වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක තමයි ලේකම් මහත්මයා සති දෙකක් නිවාඩුයි. ලේකම් මහත්තයා අපි මේ කරන්නේ මේ සභාව එකතුවෙලා තව දවස් 29 ට මේක පාලනය කරන්න ඔබතුමාලට බලය ලබා දෙන එක.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

පුෂ්පකුමාර මහතා සභා කටයුතු වල පසු විපරම කරනවා කියලා අපි හිතනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පසු විපරම් කටයුතු සදහා උපාධිධාරී පත් වීම් දෙකක් දීලා තියෙන්නේ.

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

6: 1 **2014- 09- 29** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩී.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රීඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභා</u>**

**<u>කළමණාකරන කමිටු රැස්වීම</u>**

දිනය : 2014.09.29

ස්ථානය : නගර සභාව, අම්බලන්ගොඩ.

වේලාව : ප:ව 2.30

සහභාගිත්වය : භාරත සමරසේකර මයා - ලේකම්

ඩී. ඩබ්. පත්මසිරි මයා - ගණකාධිකාරි

නිර්මලා ද සිල්වා මිය - ප්‍රධාන කළ: සහකාර

ජී. කුසුම් ද සිල්වා මිය - ප්‍රධාන කළ: සහකාර ආදායම්

වාසනා තරංගි මිය - ප්‍ර ජා සංවර්ධන නිලධාරි

ඩබ්. පි සිල්වා මිය - අභ්‍යසන්තර විගණන නිලධාරි

ආර්. සුසිලා එන් ද සිල්වා - සෞඛ්‍ය අංශය

පි. සි. සජීවනි මිය - කර්මාන්ත අධිකාරි

එම්. මලික් ප්‍ර නාන්දු - තාක්ෂනික නිලධාරි

මානෙල් රංජනි මෙවි - පුස්තකාලාධිපති

ජී. ජී. ඉල්ෂා මිය - ආදායම් පරික්ෂක

පි. එම්. ටි. විමලධර්ම - සංවර්ධන නිලධාරි

**01. පිළිගැනීම :**

- **ලේකම්, භාරත සමරසේකර මයා**

සියලුම නිලධාරීන් කළමණාකරන කමිටුව වෙත සාදරයෙන් පිළිගන්නවා.

**02. පසුගිය කළමනාකරණ තිරණ පසු විපරම:**

- **ලේකම්, භාරත සමරසේකර මයා**

ආදායම් අංශය සඳහා වූ තිරණය ක්‍රියාත්මක වුවාද?

- **ප්‍රධාන කළ: සහකාර ආදායම්, ජී. කුසුම් ද සිල්වා මිය**

සිතාර මයා චන්න මයා හා ආශෝක මයා වරිපනම් එකතු කිරිම සඳහා යොමු කළ අතර ඔවුන් එම කාර්යන් හි නිරත වේ. සිල්වා මයා එම කාර්ය ඉටු කිරිමක් දක්නට නොමැත.

➢ **ආයතන අංශය පිළිබඳ සාකච්ඡා කිරිම**

- **ලේකම්, භාරත සමරසේකර මයා**

ආයතන අංශයට මුළු ආයතනයම අයත් වේ. ඊලග අවුරුද්දේ කාර්ය සාධනය සඳහා දැන් සිටම සූදානම් විය යුතුයි. ඒ සඳහා ලිපිගොනු සකස් කිරිම, කෝලප් ඩයිරි වල රාජකාරි දේවල් පමණක් සටහන් කර පෞද්ගලික දේවල් නොලියන ලෙස දැනුම් දෙන්න. මල් පැළ ටිකත් විධිමත් ලෙස නඩත්තු කිරිමක් සිදු කරන්න.

- **ප්රොධාන කළ: සහකාර, නිර්මලා ද සිල්වා මිය**

නිවාඩු පරික්ෂා කිරිම හරිම අපහසුතාවයකට පත් වී තිබෙනවා. නිවාඩු ඉල්ලුම්පත් ලබා දී නැති නිසා. ආයතන නිලධාරින්ගෙන් ලබා ගත හැකි වුවත් සෞඛ්යව අංශයේ නිවාඩු ඉල්ලුම්පත් ලබා ගැනිම ඉතා අපහසුය. කර්මාන්ත අංශයේ මෙන් සෞඛ්යා අංශයටත් වැඩපිළිවලක් සකස් කර කිරිම වැදගත්.

❖ **තිරණය : ලබාගත් නිවාඩු සඳහා නිවාඩු ඉල්ලුම්පත් ලබා දෙන ලෙස පොදුවේ ලිපියක් සකස්කර සියලුම නිලධාරින් වෙත දැනුම් දීමක් සිදු කරන ලෙස තිරණය විය.**

➢ **ගිණුම් අංශය පිළිබඳ සාකච්ඡා කිරිම**

- **ගණකාධිකාරි, ඩී. ඩබ්. පත්මසිරි මයා**

ජයාපිටපත් යන්ත්රපය මාසයකට වඩා අධික කාලයක් ඩර ම් එක නොදමා පාවිච්චි නිසා අඩු මුදලකින් සිදු කිරිමට තිබෙන අලුත් වැඩියාව අධික මුදලක් වැය කිරිමට සිදුවන බව මෙට්ට්රෝමපෝලිටන් ආයතනයෙන් පැමිණි නිලධාරියා ප්රඅකාශ කරන ලදී. මේ නිසා අලුත් වැඩියා කිරිම් පිළිබඳ රාජකාරි පවරා ඇති නිලධාරියාව දැනුවත් කළ යුතුය. වත්කම් පරිහරනය කරන නිලධාරින් හෝ සුළු සේවකයින් මේ බව නොපමාව වාර්තා කළ යුතුය. අනු යතුරු දැනට පෙට්ටියක දමා තිබේ. මෙම අනු යතුරු ලේඛනයක් සකස් කර අංශ ප්ර ධානින්ට බාර දිමට කටයුතු කරන්න.

2015 අයවැය කාල සටහනට අනුව ඔක්තෝම්බර් 07 වන දින මූලික ඇස්තමේන්තු සාකච්චාවක් තිබ්මට යෝජනා කර තිබේ. එදාට පැමිණේන නිලධාරින් කලින් ඉදිරිපත් කර දේ වලට අමතරව පසුව හදුනාගත් තොරතුරු තිබේ නම් රැගෙන එන ලෙස දැනුම් දෙන්න.

හිග ආදායම් එකතු කිරිම තවදුරටත් කඩිනම් විය යුතුයි. මේ සම්බන්ධයෙන් සාකජාවක් සතියකට වතාවක් පැවැත්විමට දැනුම් දී තිබුනද මේ වනතේක් කිසිදු සාකජාවක් පවත්වා නොමැත. සාකජාවක් පැවැත්විම තුලින් වරිපනම් එකතු කිරිමේ ප්රබවනතාව, මේ සම්බන්ධයෙන් පවතින ගැටලු ආදි තත්වයන් පිළිබදව දැනුවත් කළ හැකිය. වරිපනම් එකතු කිරිමේ 2014 ඇස්තමේන්තුව ලක්ෂ 71ක් වන අතර සැත්තැම්බර් 22 වන විට 49% ක ප්රිතිශතයක් එකතුකර තිබේ. මෙම ප්රකතිශත මුදල මාස 06ක් එනම් ජුනි 31 එකතු වුනානම් ගැටලුවක් නෑ. මෙම තත්වය තුළ වරිපනම් එකතුකිරිම යහපත් නැත. වරිපනම් එකතු කිරිමේ නිලධාරින් හිග එකතු කිරිමට යාමේ දී සමහර දේපල සම්බන්ධයෙන් හිග වරිපනම් අය කර ගැනිමට නොහැකි බවට සාධාරන හේතු පැහැදිලි වේ නම් එම හේතු වාර්තා කොට ඒ බව සභාවට වාර්තා කර අනුමැතිය ලබා ගෙන විෂය භාර අමාත්ය තුමා වෙත අනුමැතියට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන්න. තවද බොහෝ දේපල වල වත්කම් තක්සේරු වට්නාකම් තාවකාලිකව තක්සේරු කර ඒ බව වාර්තා කරන ලෙස ඉදිරිපත් කරන්න.

වර්තමානයේ හොර නෝට්ටු සැරිසරන බැවින් අප ලබා ගන්නා මුදල් පරික්ෂා කිරිම සඳහා මුදල් හදුනා ගැනිමට හා ගණනය කිරිමට හැකි යන්ත්රරයක් ලබා ගැනිමට යෝජනා කරනවා

❖ **තීරණය : මුදල් හදුනා ගැනිමට හා ගණනය කිරිමට හැකි යන්ත්රරයක් මිළදී ගැනිමට තීරණය කරන ලදී.**

➢ **ආදායම් අංශය පිළිබඳ සාකච්ඡා කිරිම**

- **ප්‍රයධාන කළ: සහකාර ආදායම්, ජී. කුසුම් ද සිල්වා මිය**

එකතු කරන් එන වරිපනම් මුදල් බැදීම අශෝක මයා ප්‍රයමාද කර තිබුණා.

- **ගණකාධිකාරි, ඩී. ඩබ්. පත්මසිරි මයා**

එකතු කරන් එන වරිපනම් මුදල් බැදීම එදිනම ගෙවිය යුතු බව දන්වා සිටින්න. එදින යම් හේතුවක් නිසා ගෙවීමට නොහැකි වුවොත් පමණක් ඊලග දින උදේ 10.00ට පෙර ගෙවිය හැකිවේ.

➢ **කර්මාන්ත අංශය පිළිබද සාකච්ජා කිරිම**

- **තාක්ෂණික නිලධාරි, එම්. මලික් ප්‍ර0නාන්දු**

ටෙලර් දෙකේ වැඩ ඉවර කරගන්න බැරි වුනා බඩු ලබාගන්න බැරි වුන නිසා. බඩු ලබා දෙන්න බෑ කිවුවා කලින් ගත්ත බඩු වගයක මුදල් දීපු නැති නිසා.
අධිකරණ නියෝගයක් ලබා දී තිබෙනවා සෑම ගොඩනැගිල්ලක් ප්‍රනවේෂයේම ආබාධිත පිවිසුමක් සකස් කළ යුතු බවට. මෙය සකස් කිරිමට සිමෙන්ති කොට්ට 10 පමණක් අවශ්‍යධව ඇත.

- **ගණකාධිකාරි, ඩී. ඩබ්. පත්මසිරි මයා**

මෙයට සිමෙන්ති කොට්ට 10ය ලබා දිමට කඩිනමින් කටයුතු කරන්නම්.

- **කර්මාන්ත අධිකාරි, ජී. සි. සජීවනි මිය**

ළමා උද්‍යානන ආරක්ෂාවට කවුරු හරි භාරකාරයෙක් දැම්ම වැදගත් ළමයි ඇවිත් එහි තිබෙන වටිනා පැළ කඩලා දාලා තියෙනවා. වැඩිහිටියෝත් ඔන්චිලි පදිනවා. මෙම තත්වය නිසා උද්‍යාෟන භාරකරුවෙක් අවශ්‍ය.ට ඇත. යෝජනාවක් ලෙස කඩයකුත් නැති නිසා පුංචි කඩ පොඩියක් දමා එයින් ආදායමක් ලබා ගැනීමත්, පුද්ගලයෙක් සිටින නිසා උද්‍යාකන භාරකරු ලෙස ඔහු පත් කර හැකි බවත් යෝජනා කරනවා.

- **ලේකම්, භාරත සමරසේකර මයා**

සභාපතිතුමා එක්ක සාකච්ජාවකට සිදුකර තිරණයකට එලඹිම වැදගත්.

➢ **සෞඛ්‍යාය අංශය පිළිබද සාකච්ජා කිරිම.**

- **සෞඛ්‍යා අංශය, ආර්. සුසිලා එන් ද සිල්වා**

සෞඛ්‍යෂශයේ කටයුතු සිදුවෙමින් පවතිනවා. කාර්ය සාධනය පිළිබදව ම.සෞ.ප. සංජීව මහතාට සභාපති තුමා ප්‍රසංසා කළා.

➢ **ප්‍රජා අංශය පිළිබද සාකච්ජා කිරිම.**

- **ප්‍රජා සංවර්ධන නිලධාරිවාසනා තරංගි මිය**

කිමට තරම් විශේෂ ගැටළුවක් නොමැත.

➢ **පුස්තකාල අංශය පිළිබද සාකච්ජා කිරිම.**

කියවිමේ මාසය වෙනුවෙන් පැවැත්වු තරග සියල්ලම අවසන්. දැන් තිබෙන්නේ තෑගි ලබා දීමේ උත්සවය පැවැත්වීමයි. ඒ සඳහා සුදානම් වෙමින් පවතිනවා.

**03. රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම :**

- **ගණකාධිකාරි, ඩී. ඩබ්. පත්මසිරි මයා**

ස්තුති කතාව කිරීම හා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.

සකස් කළේ : පි. එම්. ටී. විමලධර්ම (සංවර්ධන නිලධාරි)

අත්සන : ...................................

දිනය :

ලේකම්,

නගර සභාව - අම්බලන්ගොඩ.

**ඒ අනුව 2014 -09- 29 දින පවත්වන ලද කළමණාකරන කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014- 09- 30** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩී.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මුලාසනය දැරූ 2014/09/30 දින පුස්තකාල කමිටු වාර්තාව.</u>**

| | |
|---|---|
| ■ ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | (ගරු සභාපති) |
| ■ කේ.ඩබ්. රංජනී මානෙල් මෙනවිය | (පුස්තකාලයාධිපතිනි) |
| ■ ඩී.වී. වාසනා තරංගි මිය | (ප්‍රජා සංවර්ධන නිලධාරිනි) |
| ■ සිරිපාල මාදුවගේ | ( කමිටු සාමාජික ) |
| ■ සුගත් හෙට්ටිආරච්චි මහතා | (කමිටු සාමාජික) |
| ■ ටී.ඩබ්ලිව්. හරිස්චන්ද්‍ර මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ ආර්.පී. අමරසිංහ මිය | (උපගුරු ගා/ ශ්‍රී දේවානන්ද විද්‍යාලය) |
| ■ පී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | (පුස්තකාල සාහායක) |
| ■ ගෞරී වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එස්. සුසිලා දීපානි මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.පී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එම්.ඩබ්.ජේ. සුමංගලි මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ මාලති සමන්තා ආරියසිංහ මිය | (පුස්තකාල සාහායිකා) |

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව 2.30ට සභාවේ වැඩ ආරම්භ කළේය.

■ **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කරන ලදි. හිරේවත්ත හා කෙරමිණිය ශාඛාවල සේවය කරන පුස්තකාල සහායිකාවන් දෙදෙනා අසනීප බැවි ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා ප්‍රකාශ කළේය. එම ශාඛාවල වාර්තා ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලදි. අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ද, විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව ප්‍රධාන පුස්තකාලයේ සේවය කරන පියන්ති මෙනවිය විසින් ද, ඉදිරිපත් කරන ලදි.

■ ජාතික කියවීම් මාසයේ උත්සවය ගැන ගරු සභාපතිතුමා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගෙන් විමසන ලදි. ජාතික කියවීම් මාසය 2014 ඔක්තෝම්බර් දසවැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් නිකුත් කර ඇති ලිපිය ප්‍රජා සංවර්ධන නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලදි.

■ එහිදී ගරු සභාපතිතුමා කාර්ය සාධන තරගය පිලිබඳව පුස්තකාලයාධිපතිනියගෙන් කරුණු විමසුවේය. සාමාජික කාඩ්පත් හිමි අයගේ විස්තර (ප්‍රදේශයේ ජනගහණය, සංඛ්‍යා තොරතුරු) ඇතුලත්ව නොතිබුණු බව අඩුපාඩුවක් බැවි කාර්ය සාධන නිලධාරිහු කියාසිටි බව පුස්තකාලයාධිපතිනිය පැවසුවේය. සෑම ශාඛා පුස්තකාලයකම කියවීම් මාසය වෙනුවෙන් තරග පැවැත්වීමටත්, ප්‍රදේශ වාසීන්ගේ අනුග්‍රහය ලබා ගන්නා ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

■ වර්ග අඩි 300ක ප්‍රමාණයක ඉඩලබා දිය හැකිනම් පුස්තකාලයට ඥානසල ආයතනයෙන් පරිගණක ලබා දීමට කැමති බව දන්වා එවා ඇති බවත් ඒ පරිගණක ගැනීමට කැමැත්ත ප්‍රකාශ කොට ලිපියක් මඟින් දන්වා යවන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට පැවසුවාය.

■ කියවීම් මාසයේ උත්සවය සඳහා නගර ශාලාව මේ මස 27 හා 28 යන දෙදින වෙන් කළයුතු බවද එම විෂය භාර නිලධාරිතුමිය කැදවා ගරු සභාපතිතුමා පැවසුවේය. තෑගි උත්සවයේ සහතික පත්‍ර මුද්‍රණය කර ගැනීම සඳහා ඩොට් ප්‍රින්ට් යන්ත්‍රයක් ලබා ගැනීම සුදුසු බව ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය පැවසුවේය. එයට කමිටු මහතුන්ගේ කැමැත්ත ප්‍රකාශ කළේය.

■ වාසනා ප්‍රකාශකයෝ විසින් පොත් ප්‍රදර්ශණයක් පැවැත්වීම සඳහා නගර ශාලාව දින 6 ක් සඳහා නොමිළේ ලබා දෙන්නේ නම් එම පොත් විකුණු ආදායමෙන් 50% ක් වටිනා පොත් පුස්තකාලයට ලබා දීමට කැමැත් ප්‍රකාශ කොට ඇති බව ප්‍රජා සංවර්ධන නිලධාරිනිය පැවසුවාය. ගරු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජික මහතුන් එයට කැමැත්ත ප්‍රකාශ කළහ.

■ සාහිත්‍ය මාසය වෙනුවෙන් පොත් මිලදී ගැනීමට ලක්ෂ 2ක මුදලක් ලබාදෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය. තවද මේ මස සාහිත්‍ය උත්සවයට පෙර 15-20 අතර දිනයක් කමිටුවට වෙන් කළයුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

■ හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ ගෞරි මහත්මිය කියා සිටියේ කියවීම් මාසයට වෙනුවෙන් වැඩ සටහනක් සකස් කර ඇති බවයි. එම ප්‍රදේශයේ ගරු නගර සභා මන්ත්‍රී කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා විසින් ජයග්‍රහන ලාභීන්ට තිළිණ ලබා දෙන බව එම මහත්මිය ප්‍රකාශ කළාය.

■ හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ විදුලි පංකාව තිබුණත් එම සහයිකාව සිටින තැනට සිටවන විදුලි පංකාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය. පාඨක අදහස් පොත් බැලීමෙන් පසු ප්‍රධාන පුස්තකාලයේ මදුරු කරදරය හේතුවෙන් වැසිකිළි වලට එහා තිබෙන සිලින්ඩර දමා සකසා ඇති වල හැකි ඉක්මණින් වසා දැමිය යුතු බැවි ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය. පුවත්පත් අංශයට විදුලි පංකාවක් ඉල්ලා ඇති නිසා සිටුවන ලද විදුලි පංකාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

■ පෝරඹ පුස්තකාලයට "මව්බිම " පුවත්පත ඉල්ලා ඇති බවත් අඩු පාඨක පිරිසක් බලන ඉරිදා පුවත්පතක් අඩු කොට එය ලබා ගැනීම සුදුසු බව සභාපතිතුමා පැවසුවේය.

■ විද්‍යුත් පුස්තකාලයේ පරිගණක අඩුපාඩුවක් තිබේද, වර්ධනයක් තිබේද යන්න ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියගෙන් කරුණු විමසුවේය. නිවාඩු මාසයේ පමණක් පරිගණක අඩු බව පෙනී ගිය බව එතුමිය පැවසුවාය.

■ ඔක්තෝම්බර් 28 වන දින කියවීම් මාසයේ උත්සවය පැවැත්වීමට ගරු සභාපතිතුමා තීරණය කළේය. එයට සියලු දෙනාම කැමැත්ත ප්‍රකාශ කළහ. දේශකතුමා හමු වී වේදිකාව සැරසීම කෙසේ සිදුවිය යුතුද යන්න පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය. පාසල් සිසුන් සහභාගි වන බැවින් ප.ව. 12.30ට උත්සව කටයුතු අවසන් කළයුතු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

■ දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමා, හිටපු පළාත් සභා, නගර සභා මන්ත්‍රීවරු, පුස්තකාල කමිටු සාමාජික මහතුන්ට ආරාධනා කළයුතු බව පැවසුවේය. නිවේදක කටයුතු සඳහා කථික තරගයෙන් ජයග්‍රහනය ලබා ගත් සිසුන් යොදා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

■ වේදිකාව ඇතුලත තිරය පරණ බැවින් අලුතින් තිරයක් දැමීම සුදුසු බව කමිටු මහතුන් කියා සිටියේය. උත්සවයට පෙර සතියකට කලින් වේදිකාව සරසන ආකාරය පිළිබඳව දැනුවත් කරන ලෙසත් ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනියට උපදෙස් දෙන ලදි.

■ ඕකන්ද ශාඛා පුස්තකාලයට මිලදී ගත් සාමාන්‍ය පෙළ සුජය පුවත්පත දැන් මුද්‍රණය නොවන බැවින් ඒ වෙනුවට සිරිකත පුවත්පත මිලදී ගන්නා ලෙස පාඨක පිරිසක් ඉල්ලා ඇති හෙයින්, එම පුවත්පත ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා පැවසුවේය.

■ වෙනත් කරුණු ඉදිරිපත් නොවු බැවින් ස්තූති කතාව සඳහා ගරු සභාපතිතුමා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ආරාධනා කළේය. එහිදි එතුමිය ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තූතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

.........................................
කමිටු ලේකම්,
නගර සභාව අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ......................................... | ............................................. |
| ලේකම්, | අත්සන් කළේ සභාපති, |
| නගර සභාව අම්බලන්ගොඩ. | නගර සභාව අම්බලන්ගොඩ. |

**ඒ අනුව 2014 -09- 30 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3 2014- 09- 23** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම් . ඩී.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදි

**<u>පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**
**<u>2014.09.23 ප.ව. 2.30</u>**

## සහභාගීත්වය

- ❖ ඇම්.ඩබ් අරුණ ප්‍රදීප. ගරු සභාපති,අම්බලන්ගොඩ නගරසභාව
- ❖ පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. ගරු නගරසභා මන්ත්‍රී, අම්බලන්ගොඩ
- ❖ ජේ.ඩබ්.භාෂිනි විජේසූරිය මහත්මිය . ගරු නග සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගරසභාව.
- ❖ කේ.පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා. ගරු නගරසභා මන්ත්‍රී, අම්බලන්ගොඩ.
- ❖ කේ.සී.කපිල කුමාර මහතා. උප පොලිස් පරීක්ෂක, අම්බලන්ගොඩ පොලිසිය.
- ❖ ඩී.වී.තරංගි මහත්මිය. ප ‍ජා සංවර්ධන නිළධාරි, අම්බලන්ගොඩ නගරසභාව.
- ❖ ජී.සී.සජීවනී මහත්මිය. තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගරසභාව.
- ❖ බී.ඩී.ඉ.කොඩිතුවක්කු මහත්මිය. ප.සෞ ෟ. සේ.නිලධාරි. අම්බලන්ගොඩ නගරසභාව.
- ❖ එම්.මලිත් ප්‍රනාන්දු මහතා. තාක්ෂණ සේවා නිලධාරි, අම්බලන්ගොඩ නගරසභාව.
- ❖ පී.එස්.එස්.ද සිල්වා ම.සෞ ෟ.පරීක්ෂක. අම්බලන්ගොඩ නගරසභාව.
- ❖ එම්.ඩබ්.හිරාන් සංජීව මහතා සෞ ෟඛ්‍යධ පරිපාලක.
- ❖ එම්.පී.බී.ඩබ්.යු.කුමාරි. අයුර්වේද වෛද්‍ය නිළධාරිනි.
- ❖ ආර්.සුසිලා නන්දනි. කළමණාකරණ සහකාර.

**පිළිගැනීම.**

**ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.**
සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රී තිදෙන ඇතු□ සියළු නිලධාරි මහත්ම මහත්මීන් නගර සභා කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

**2014.08.27 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය**

| මාතෘකාව | සාකච්ඡා වූ කරුණු | ප්‍රකාශය කවුරුන් විසින්ද යන වග | තීරණය |
|---|---|---|---|
| කාර්ය සාධනය වෙනුවෙන් සෞඛ්‍ය අංෂයට විශේෂ ස්තුතියක් පිරිනැමීම | | ගරු සභා පතිපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| වාර්ෂික උපත් සංඛ්‍යාව සංඛ්‍යා ලේඛන ගත කරයුතු බව | අම්බලන්ගොඩ නගරසභා බල ප්‍රදේශයේ වාර්ෂික උපත් සංඛ්‍යාව පිළිබඳ සංඛ්‍යා ලේඛන තබාගත යුතු බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| සුනඛ වන්ද්‍යකරණය | සුනඛ වන්ද්‍යකරන සැත්කමෙහි වර්තමාන තත්වය විමසීම හා ඒ සඳහා පශු වෛද්‍ය වරයාගේ සහය ලබා ගැනීම උචිත බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| ලොන්ඩ්‍රි ජලය බැහැර කිරීම | පොලිසිය අසල ලොන්ඩ්‍රියේ බැහැරලන ජලය නියමිත පරිදි බැහැරලනවාද යන වග | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | නියමිත පරිදි ජලය බැහැර කරලන බව |
| කාණු පද්ධතිය පිරිසිදු කිරීම | ඔකඩ ඇල අසල කාණු පද්ධතිය පිරිසිදු කළ යුතු බව සහ ඉන් ඉවතලන අප ද්‍රව්‍ය මහජනතාවට අවහිරයක් නොවන පරිද්දෙන ඉවත් කිරීම කළ යුතු බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| | අම්බලන්ගොඩ බස්නැවතුම්පල ඉදිරිපිට රාත්‍රි යාමයේ පවත්වාගෙන යන තේ වෙළද සැළේ තේ පිළියෙල කරන පුද්ගලයා පුළිබඳ මහජනතාවගේ අප්‍රසාදය පලවී ඇති බව සහ ඒ ප්ළිබඳ කරුනු සොයා | | |

| | | | |
|---|---|---|---|
| | බළන ලෙස සාකච්චා වීම | | |
| | පටබැඳිමුල්ල සරත් මන්ත්‍රි තුමාගේ නිවස අසල ගස් කපා ගොඩ ගසා ඇති බවත් සතියක් පමණ වන නමුත් ඒවා ඉවත් කර නොමැති බව සහ ඒවා ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කල යුතු බව | | |
| නගරයේ එකතු වන කසල පිළිබඳ ප්‍රශ්නය | කසල නියමිත පරිදි බැහැර නොකරන්නට එරෙහිව පසුගිය මාසය තුළ නඩු 04 ක් දමා ඇති බව | උප පොලිස් පරික්ෂක කේ.සී කපිල ක ුමාර මහතා | |
| නගරයේ එකතු වන කසල ඉවත් කිරීම | මහජනතාව විසින් ඉවත ලන කසල සහ අප ද්‍රව්‍ය නියමිත ස්ථාන වලට නොදමීම හේතුවෙන් මාර්ගය අපවිත්‍ර වන බව සහ ඒවා ගෙන යන තුරු නිවසේ තබා ගැනීම සුදුසු බව සාකච්ජා වීම | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| කසල කළමණාකරනය | ඉවතලන අප ද්‍රව්‍ය දිරන සහ නොදිරන වශයෙන් වෙන් කිරීමක් කර ප්‍රයෝජනවත් පරිදි යොදා ගත හැකි බව සහ කොම්පෝස්ට් පිළියෙල කිරීමට අවදානය යෙමු කිරීම සුදුසු බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | කසල අවසන් බැහැරලන ස්ථානය මේ සඳහා යොදා ගැනීම සුදුසු බව |
| දැනුවත් කිරීමේ වැඩසටහනක් සන්විධානය කිරීම | ආයුර්වේද වෛද්‍ය තුමිය හරහා ගැබිනි මාතාවන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් සංවිධානය කිරීම ප්‍රයෝජනවත් බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| ආයුර්වේදයේ ඖෂධ ප්‍රමානවත් නොවන බව | ආයුර්වේදයේ ප්‍රමානවත් පරිදි ඖෂධ නොමති බව සහ ඖෂධ හිගයක් ඇති බවත් නිතර පරිභෝජනයට ලක් වන ඖෂධ නිෂ්පාදනයට අවදානය යොමු කිරීම සුදුසු බව සහ මහජනතාවට අපහසුවකිකන් තොරව ඖෂධ ලබා ගැනීමට පහසුකම් සැලසීම සුදුසු බව | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| ස්තූති කතාව | කමිටුවේ සාකච්ජා වූ කරුනු වලින් ලැබෙන ප්‍රතිලාභ මහජනතාව වෙත ගලා යායුතු බව සහ එහිදි පැන නගින ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු සහ අඛන්ඩව ප්‍රශ්න විසඳිමට නිලධාරි සභය ලබා දිය යුතු බවත් අද දින රැස්වීම සදහා පැමිණි සියලුම නිලධාරි මහත්ම මහත්මින්ට ස්තූතිය පුදකරන බව ප්‍රකාශ කරන ලදි | නගරසභා මන්ත්‍රි ජ සරත් ශ්‍රිලාල්ද සිල්වා මහතා | |
| නිමාව | ප. ව. 4. 30 | | |

සකස් කළේ :
ආර්.සුසිලා නන්දනී ද සිල්වා
සංවර්ධන සහකාර (පරිසර)

ලේකම්
භාරත සමරසේකර

**ඒ අනුව 2014 -09- 23 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක වාර්තාව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ක්‍රීඩා කමිටුව පැවැත්වුවේ නැද්ද. ලේකම් මහත්මයා ක්‍රීඩා කමිටුව වගේ දේවල් සෑම මාසයකම පවත්වන්න ඕන. අදාල දිනයේ බැරි වුනත් පසුව හරි පවත්වලා වාර්තාව ඉදිරිපත් කරන්න ඕන.මොකද කාර්යය සාදනයේදී මේ වාර්තා නැති වුනොත් ලකුණු නැති වෙනවා.

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

### 7:1 ටෙන්ඩර් හා මිළගණන් :-

### 7:1:1 ටෙන්ඩර් :- නැත

### 7:2 මිල ගණන් :-

අද දින කැඳවන ලද සියලුම ටෙන්ඩර් අවලංගු කරනු ලැබූ අතර ටෙන්ඩර් පෙට්ටිය නිසි පරිදි සීල් කළ පසු නැවත ටෙන්ඩර් කැඳවීමට සභාව තිරණය කරන ලදී.

## (08) ගෙවීම්

8.1 කා.නි. කිරීමේ අංක 0348 යටතේ අම්බලන්ගොඩ මෝය කට අසල ඇති පිහිනුම් තටාකයේ වෙල්ඩින් අංශයේ අලුත්වැඩියා කටයුතු කිරීම වෙනුවෙන් අම්බලන්ගොඩ ප්‍රනාන්දු ඉංජිනියරින් ආයතනයට වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.12740/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.2 ඇ. අංක 1087 යටතේ ලබා ගත් LP Gas Sylinder 08 සඳහා අම්බලන්ගොඩ, මිලිදු එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

රු. 7218.00 x 08 = 57744.00

8. 3 ඇ. අංක 1088 යටතේ 2014 නගර ක්‍රීඩා උත්සවය සඳහා සහතික පත් 975 මුද්‍රණය කර ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 43875.00ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.4 ඇ. අංක 1092 යටතේ කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රයට ඩ්‍රම් යුනිට් එකක් ගැනීම වෙනුවෙන් මාතර මෙට්‍රොපොලිටන් 'පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 32200.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

වටිනාකම = 28750.00<br>
12 Vat මුදල = 3450.00<br>
එකතුව = 32200.00

8.5 ඇ. අංක 1093 යටතේ AOC 19 LED Monitor එකක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ ටියුලිප් ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 11100.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.6 ඇ. අංක 1094 යටතේ ලබා ගත් 3User Kasperskey Virus Guard 05 සඳහා අම්බලන්ගොඩ ඔමැක් ටෙක්නොලජි ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 14000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

රු. 2800.00 x 5 = 14000.00

8.7 ඇ. අංක 1095 යටතේ ලබා ගත් පරිගණක උපකරණ සහ තීන්ත වෙනුවෙන් අම්බලන්ගොඩ ඔමැක් ටෙක්නොලජි ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

HP Leser Jet Printer (1102) = 12500.00 x 01 = 12500.00
HP 85 A Leser Jet P 1102 INK = 7250.00 x 02 = 14500.00
= 27000.00

8.8 ඇ. අංක 1098 යටතේ ලබා ගත් ටයර් හා ටියුබ් වෙනුවෙන් සී / ස ශ්‍රී ලංකා රජයේ විවිධ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු.103000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

750 x 16 ටයර් 06 x රු . 17000.00 = 102000.00
600 x 12 ටියුබ් 02 x රු . 500.00 = 1000.00
= 103000.00

8.9 ඇ. අංක 1101 යටතේ ලබා ගත් LP Gas Sylinder (37.5 x 8) 08 සඳහා අම්බලන්ගොඩ මිලිදු එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

රු. 7218.00 x 08 = 57744.00

8.10 නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා 2014 අගෝස්තු මාසයට සපයන ලද පුවත්පත් වෙනුවෙන් රු. 42160.00ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8.11 සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගේ මැයි ජුනි ජුලි මාස වලට අදාලව සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද ගමන් වියදම් සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8.12 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2014 යටතේ පටබැදිමුල්ල ජල කරාමය අසල සිට මුහුදු වෙරළ පාර දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු. 629276.50ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි අංක 86 , පොල්වත්ත ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8.13 2014 අප්‍රේල් මැයි ජුනි ජුලි මාස සඳහා වන හිග වරිපනම් බදු රු.309559.01 එකතු කිරීමට අදාලව ආදායම් පරිපාලකවරු හා බදු එකතුකිරීමට සම්බන්ධ වු නිළධාරින්ට අදාල කොමිස් මුදල් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8:14 2014 අගෝස්තු මාසය සඳහා වැට් බදු මුදල් සභා ආවරණ අනුමැතියට යටත්ව රු.50000/= දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8:15 නගර සභාව සතු 49-9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 සැප්තැම්බර් මස 01 සිට 15 දින දක්වා ලබා ගත් ඉන්ධන වෙනුවෙන් රු.10777.20 ක මුදලක් තාක්ෂණසේවා නිළධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාරයට ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8:16 නගර සභාව සතු 252-0730 අංක දරණ කැබ් රථය සඳහා 2014 සැප්තැම්බර් මස 01 සිට 15 දින දක්වා ලබා ගත් ඉන්ධ රු.15985.20 ක මුදලක් තාක්ෂණසේවා නිළධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8:17 කසල අවසන් බැහැරලන ස්ථානයේ අගෝස්තු හා සැප්තැම්බර් මාස වල D4E යන්ත්‍රය යොදාගෙන කසල තුනී කිරීම සහ පස් තුනී කිරීම වෙනුවෙන් රු.404544.00 ක මුදලක් මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ සහ !ලේකම්ගේ නිර්දේශය මත ඇල්පි විස්කම් කොන්ක්‍රීට් ආයතනයට ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

| | | |
|---|---|---|
| මීටර පැය 120.4 x 3000.00 | = | 361200.00 |
| Vat | = | 43344.00 |
| | = | 404544.00 |

8:18 2014 - II කාර්තුව වෙනුවෙන් ගලි රථයේ ණය වාරිකය සඳහා බැංකුව අය කළ රු. 55350.78 ක මුදල ගිණුම් ගත කිරීම සඳහා පොදු ගිණුමෙන් චවුචරය ඉදිරිපත් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

8:19 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2014 යටතේ හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ හරස් පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු . 739816.98 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි අංක 86, පොල්වත්ත ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි. ,

8:20 2014 ජුලි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවු මුදල |
|---|---|
| 11453-1 | 59398.66 |
| 23453-1 | 2214.76 |
| 34453-1 | 2879.38 |
| 52453-1 | 42739.83 |
| 53454 | 17218.42 |
| 62453-1 | 29826.88 |
| | 154277.93 |

විදුලි බිල්පත් සඳහා රු. **154277.93** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට අනුමැතිය ලබාදෙන ලදී

8:21 2014 ජුනි මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවු මුදල |
|---|---|
| 11453 -11 | 9051.84 |
| 23453-11 | 26740.36 |
| 34453-11 | 829.92 |
| 52453-11 | 11343.10 |
| 62453-11 | 25667.88 |
| | 73633.10 |

දුරකතන බිල්පත සඳහා රු **73633.10** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට අනුමැතිය ලබාදෙන ලදී

8:22 2014 ජුනි මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවු මුදල |
|---|---|
| 11452 | 25354.45 |
| 12452 | 1236.56 |
| 25451 II | 1211.73 |
| 62452 I | 4259.79 |
| | **32696.81** |

දුරකතන බිල්පත සඳහා රු **32696.81** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට අනුමැතිය ලබාදෙන ලදී.

8:23 හිරේවත්ත නාන තොටුපල අසල පිහිනුම් ක්‍රීඩකයන් සඳහා ඇඳුම් මාරු කිරීමේ කුටියක් ඉදිකිරීමේ කර්මාන්තය අතිරේක වැඩ වෙනුවෙන් 10% රැඳවුම් මුදල වන රු. 12550.10 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:24 පින්නදූව වට රවුම පළමු හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් 10% රැඳවුම් මුදල වන රු. 20507.51 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:25 පටබැඳිමුල්ල ළමා උද්‍යානය ඉදිකිරීමේ කර්මාන්තය අතිරේක වැඩ වෙනුවෙන් 10% රැඳවුම් මුදල වන රු. 32177.69 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2014 අගෝස්තු මස සඳහා වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, ලැබීම් විග්‍රහය හා මුදල් සාරාංශය සභාගත කරන ලදී.

ඒ අනුව 2014 ජුලි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**නැත**

**(11)**

## වෙනත් කරුණු

**11:1** ' 2014 වර්ෂයේ දෙවන භාගයට අදාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මිළ ගණන් ' මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 වර්ෂයේ දෙවන භාගයට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා මිල ගණන් දන්වා එවන බවත් මේ සම්බන්ධයෙන් සියලුම තාක්ෂණ සේවා නිළධාරීන් දැනුවත් කරන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අතර මෙම මිල ගණන් සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** ' නගර සභා මාර්ග තලනය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

නගර සභාවේ මාර්ග තලනය අලුත් වැඩියා කිරීම සම්බන්ධව 2014.09.18 වන දින සභාපතිතුමා උප සභාපතිතුමා තාක්ෂණ සේවා නිළධාරී මලිත් මහතා වැඩ පරිපාලක ඇල්ටන් මහතා හා කාර්මික ක්‍රිෂාන්ත මහතා සමග සාකච්ඡා කිරීමේදී ලැබුණු උපදෙස් පරිදි පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු රිස්වි මහතාව 2014.09.19 වන දින හමුවූ බවත් එහිදී මාර්ග තලනයට සවි කිරීමට මිළ ගණන් ලබාගෙන ඇති එංජින් යන්ත්‍ර වල තොරතුරු හා සවි කිරීමේ හැකියාව පිළිබඳව ක්‍රිෂාන්ත මහතා විසින් යාන්ත්‍රික ඉංජිනේරු මහතාට පැහැදිලි කළ බවත් ඒ අනුව එංජින් යන්ත්‍රයක් මිලදී ගෙන සභාව තුළදී මාර්ග තලනයට සවිකිරීම හා බාහිර ආයතනයකට මාර්ග තලනය ලබා දී නව එංජිමක් සවිකර ධාවන තත්වයෙන් ලබා ගැනීම යන කාර්යයන් දෙකෙහිම අවදානමක් හා වගකීමක් පවතින බව ඉංජිනේරු මහතා පවසන ලද බවත් එබැවින් ,

01)එංජිමක් මිලදී ගෙන සවිකිරීමට ලබා ගෙන ඇති මිල ගණන් ඇගයීම් කර නිර්දේශ ලබා ගැනීම හා ඒ අනුව එංජිම මිලදී ගෙන සභාවේදී ක්‍රිෂාන්ත මහතා මගින් මාර්ග තලනයට එංජිම සවිකිරීමට නව සභා තීරණයක් ගැනීම.

02) බාහිර ආයතනයකට මාර්ග තලනය ලබා දී නව එංජිමක් සවි කර ධාවන තත්වයෙන් ලබා ගැනීම යන දැනට ගෙන ඇති සභා තීරණය පරිදි කටයුතු කිරීම.

යන ක්‍රියාමාර්ග දෙකෙන් නිශ්චිතව අනුගමනය කරන ක්‍රියාමාර්ගය පිළිබඳව තමන් දැනුවත් කරන ලෙසද ඉහත අංක 01 අනුව එංජිමක් මිලදී ගන්නේ නම් ඒ සඳහා වගකීම් කාලය, ලබා දෙන අමතර උපාංග හා සේවා පිළිබඳව අදාළ මිළ ගණන් ලබා ගත් ලිපි ශීර්ෂයක කරුණු ඇතුලත් කර ඒ සමග මිළ ගණන් ඇගයීම සඳහා තමා වෙත යොමු කරන ලෙසත් උපදෙස් වාචිකව ලබා දුන් බවත් සඳහන් කර තිබූ අතර මේ පිළිබඳ ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා උපදෙස්ද ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සඳහා අපි ටෙන්ඩරයක් කැඳවුවා එංජිමක් සම්බන්ධයෙන්. එංජිමක් අරගෙන සභාවේ ක්‍රිෂාන්ත මහතා මගින් සවි කර ගන්න.පසු ගිය සභාවේදී උප සභාපතිතුමා යෝජනා කළා එංජින් එක සවි කරලම ගෙන්න ගන්න කියලා. නමුත් මෙහිදී මම බලපු දෙයක් තමයි ප්‍රායෝගිකව බාස් කෙනෙක් ලක්ෂ 7-8ක් වියදම් කරලා එංජිමක් ගෙනල්ලා සවි කරලා මෙහෙට භාර දෙන්න ක්‍රම වේදයක් ඉතාමත් අපහසුයි.එනිසා අපි සාකච්ඡා කරලා ඉංජිනේරු මහත්මයාට යැවුවා. ක්‍රිෂාන්ත

මහත්මයාගෙන් අවශ්‍යනම් විමසීමක් කරන්න පුලුවන්. ඔහු පවසනවා පැහැදිලිවම එංජිම ගෙනත් දුන්නොත් මෙහිදි එංජිම සවි කරන්න පුලුවන් කියලා. පිට ගැරේජ් එකකට දෙන ඒකේ ගැටලුව තියෙන්නේ ලක්ෂ 7-8 ක් දීලා එංජිමක් සවි කරලා මොන ගැරෙජ් එකෙන් වත් මාර්ග තලනය අපට භාර දෙන්නේ නෑ.මේක ලොකු කම්පැණි එකකට දැම්මොත් ලක්ෂ 20-030ක් ඉල්ලයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමා මෙය රජයේ ආයතනයක වාහනයක්. එනිසා මේක දෙපැත්ත පෙරලෙන්න පුලුවන්.හදිසියේවත් එංජිම සල්ලි වලට අරන් මේ මහත්මයා මේක සවි කරලා ක්‍රියාත්මක කරන්න බැරිවුනොත් ඒක ගැටලුවක්. අනුමත කරලා තියෙන්නේ අපිනේ. එනිසා මේක හරියට කරන්න ඕන නම් අපි තිරණ ගන්න එක නෙවෙයි කරන්න ඕන ඉංජිනේරු මහත්මයා හරි කාර්මික නිළධාරින් හරි නිර්දේශයක් දෙන්න ඕන විය යුත්තේ මෙයයි කියලා. නැතිව අපි මන්ත්‍රීවරු 12 දෙනාට මෙම කාරිය පටවන්න එපා. තමුන්නාන්සේලා ගන්න නිවරදි තිරණයක් අරන් අපට දෙන්න. අපි මේ පිළිබඳ දැනුම තියෙන අය නෙවෙයි.ඔය කීව මහත්මයාට යම් කිසි දැනුමක් තියෙනවා නමුත් එය තහවුරු කරන්න සාදක කොයිතරම් දුරට තියෙනවද කියන්න අපි දන්නෙත් නැහැ.බැරිවෙලාවත් මේක වැරදුනොත් සභාව තමයි මේකට අනුමැතිය දුන්නේ කියලා අහක ඉදපු අපිත් මේකට අධිභාර ඇවිත් අපට ගෙවන්න වෙනවා. එනිසා මේකෙදි නිළධාරින් සහ ඉංජිනේරු මහත්මයා ගන්න තිරණයකට තමයි මම කැමති වෙන්නේ. නැතිව මම එකගවෙන්නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉංජිනේරු මහත්මයා තමයි මේ නිර්දේශය දීලා තියෙන්නේ. මෙතන තියෙන යෝජනා දෙකෙන් අපි ගන්න තිරණයයි එතුමා අහලා තියෙන්නේ.මෙහෙම දෙයක් තියෙනවා. දැන් ගල් රෝල කැඩිලා මාස කීයක් වෙනවද?මාස 5ක් විතර වෙනවා. දැන් අපේ පාරවල් ටික සවුත්තු වෙමින් යනවා. එනිසා අපි මේකට කුමන හෝ පියවරක් ගන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි මම මේ කතා කරන්නේ සභාවේ තද බල අවශ්‍යතාවය මත හා මේ තියෙන තත්වය මත මේ කියන කාරණා දෙකෙහිම සත්‍යයක් තියෙනවා. විපක්ෂනායක තුමා කියන කාරණයත් සත්‍යයක්. අපි දැනට වසර15-20 පමණ සිට ක්‍රීෂාන්තව දන්නවා.මේ ආයතනයේ වැඩ කරනවා. එංජින් සම්බන්ධ දැනුමක් තියෙනවා. අපි ඒකට එකගයි.නමුත් ඔහුගේ රාජකාරියේ කොටසක් නෙවෙයි අලුතින් එංජිමක් ගෙනල්ලා සවි කරන එක. මෙය වැරදුනොත් විපක්ෂ නායකතුමා කීව කාරණයට අපට මුහුණ දෙන්න වෙනවා. නමුත් අපට මෙන්න මෙහෙම කරන්න පුලුවන්. ටෙන්ඩර් කරන්න ගරාජ් වලින් මේ එංජිම සවි කරලා දෙන්න. මම හිතන්නේ හැම ගරාජ් එකකටම මේ සම්බන්ධ දැනුම නැහැ. විස්කම් එකට පුලුවන් වෙයි. එහෙම දීලා කරගමු කියන එක තමයි මගේ යෝජනාව වෙන්නේ. මොකද ඒක නිත්‍යාණුකූලව යන්ත්‍ර සූත්‍ර හදන ආයතනයක්. එතකොට මෙහි වගකීමත් ඔවුන් ගන්නවනේ. එහෙමත් නැතිනම් සභාවට පුලුවන් නම් විශේෂ තිරණයක් අරගෙන විස්කම් එකට මේක හදන්න දෙන්න ඒත් කමක් නෑ. අපි එංජිම අරන් දෙනවා. ටෙන්ඩර් කැඳවන්නේ සවි කරන්න විතරයි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙම කරන්න බෑ. ගත හැකි ක්‍රියා මාර්ග දෙකයි තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ඒක හරි සභාපතිතුමා අපට මේ සදහා පළාත් පාලන ඉංජිනේරුතුමාගෙන් හරි විගණනෙන් හරි අවසර ගන්න වෙනවා. මොකද මේ එංජිම හැම තැනකම ඇත්තෙත් නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක ඇත්ත. මේ එංජිම හැම තැනකම නැහැ. කීප තැනකම බැලුවය කියලත් කීවා. සෙමින් යන එංජිමක්ලුනේ ඕනත්.එහෙනම් මෙහි සදහන් කරලා තියෙන ක්‍රියාමාර්ගය වන එංජිමක් මිලදී ගෙන සවිකිරිමට ලබා ගෙන ඇති මිල ගණන් ඇගයීම් කර

නිර්දේශ ලබා ගැනීම හා ඒ අනුව එංජිම මිලදී ගෙන සභාවේදී ක්‍රිෂාන්ත මහතා මගින් මාර්ග තලනයට එංජිම සවිකිරීමට නව සභා තීරණයක් ගැනීම කියන එක අනුගමනය කරමු. කිෂාන්ත මහත්මයා මීට වඩා බරපතල අවස්ථා කීපයකදීම මේ රෝල හැදුවා. මේ රෝලට දැනට වසර 50 ක් පමණ වෙනවා. අපි එක සැරයක් උඩුකාවට දාලා රෝල හැදුවා. දැන් උඩුකාව නැහැ.ඉන් පස්සේ ක්‍රිෂාන්ත මහත්මයා තමයි රෝල යම් යම් අවස්ථාවල සකස් කරලා අද තියෙන තත්වයෙන් පවත්වාගෙන යන්නේ. නැතිනම් මේ රෝල අද වෙනකොට වෙන්දේසි කරන මට්ටමට ඇවිල්ලා. නව දෙයක් එංජිමක් ගෙනල්ලා මෙතන නිකං තියලා තියන්න බෑ. හරියට මන්ත්‍රීවරු ප්‍රකාශ කරන්න මොකක්ද කරන්නේ කියලා.සම්පූර්ණයෙන්ම එංජිම සවි කරන්න ටෙන්ඩර් කරනවද එහෙම නැතිනම් එංජිම ගෙනල්ලා සවි කරන්න දෙනවද. අපි මීට පෙර අනුමැතිය දීලා තියෙන්නේ 2 වන ක්‍රියාමාර්ගයට. ඉංජිනේරුතුමන් අනුමත කරනවා එංජිම ගෙනල්ලා අපේ යාඩ් එකේ සවි කිරීම.මම තාක්ෂණ සේවා නිළධාරී ඇල්ටන් මහත්මයා සහ ක්‍රිෂාන්ත එක්ක කතා කළා මේ පිළිබඳව. ඔවුන් පැහැදිලිවම ප්‍රකාශ කහරනවා අපේ යාඩ් එකේ මේක සවි කරන්න පුලුවන් කියලා. එංජිම අරන් දෙන්න විතරයි කියන්නේ. ඉතින් ඒ වගකීම අපි ගන්න ඕන ඔවුන්ව විශ්වාස කරලා. නැතිනම් අපි වෙන විකල්පයකට යන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

ඉංජිනේරුතුමත් එය නිර්දේශ කරලා තියෙනවනේ සභාපතිතුමා.

- **පෙ. ව. 11.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලකෂ්මි හේමන්තා සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

<u>තීරණය</u>

☞ **මේ සම්බන්ධයෙන් කරුණු විමසු සභාව කාර්මික නිළධාරී මලිත් ප්‍රනාන්දු මහතාගෙන් විමසීම් කළ අතර මෙහිදී සඳහන් කළ පළවන කරුණ වන එංජිමක් මිලදී ගෙන සවි කිරීමට ලබා ගෙන ඇති මිල ගණන් ඇගයීම් කර නිර්දේශ ලබා ගැනීම සහ ඒ අනුව එංජිම මිලදී ගෙන සභාවේදී ක්‍රිෂාන්ත මහතා මගින් මාර්ග තලනයට එංජිම සවිකිරීමට නව සභා තීරණයක් ගැනීම සුදුසු බවත් එය ඉටු කිරීමට හැකි බවත් දන්වන ලදී. ඒ අනුව පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

අපේ සේවකයින් පාරවල් වල දෙපැත්ත සුද්ධ කිරීමවත් කරලා නෑ සභාපතිතුමණි. හිටපු ගමන් ඇවිත් මීටර 100 ක් විතර සුද්ධ කරලා යනවා. හරියට සුද්ධ කිරීමක් කරන්නෑ.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැනට සුද්ධ කරපු පාරවල් ටික කියන්න.ලබන සභාවට සුද්ධ කරපු පාරවල් ටික ඉදිරිපත් කරන්න. එකම කොට්ඨාශයක විතරක් කටයුතු කරන්න එපා. කොට්ඨාශ 13 ක් තියෙනවා. 13 ම පොදු විදියට වැඩ කරන්න. එනිසා නිතරම වැඩ කරන පිළිවෙළ සම්බන්ධයෙන් නිතරම සභාව දැනුවත් කරන්න. එතකොට යම් මන්ත්‍රීවරයෙක්ට හිතෙනවනම් තමන්ගේ කොට්ඨාශයට අඩුවෙන් සලකනවා කියලා මේ සභාවේදී නැගිටලා ඒක පවසන්න පුලුවන් මේක කරලා දෙන්න කියලා. අද තල්ගස්ගොඩ කලා නම් හෙට පොල්වත්තේ කරන්න. එතකොට ඔය කියන චෝදනාව එන්නෑ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

අපි මේක පොතක ලියන්න ගත්තා.දැන් ඒකත් නෑ.හදිසි වැඩක් කියලා යනවා. ඒක නම් කමක් නෑ කියමු. දැන් ගල් රෝලත් නැති ඒකේ මේ වැඩ දෙගුණයකින් කරන්න පුලුවන්නේ. නමුත් එහෙම විශේෂයක් වෙලා නෑ. තණ කොල කපන මැෂින් එක යොදා ගත්ත නම් දින 3 න් මහ අම්බලන්ගොඩ පාරවල් දෙපැත්ත සුද්ධ කරන්න පුලුවන්.

ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

තණකොළ කපන මැෂිම යොදාගන්නැද්ද ඔයාලා පාරවල් දෙපැත්ත දුද්ධ කරන්න. ඇත්තටම තණකොළ සම්පූර්ණයෙන්ම අයින් කරනවට වඩා එක ගානකට කපන එක හොදයි.

**11:3 "**අම්බලන්ගොඩ නගර සභාවේ ජංගම ගිණුම් අංක 035 -1- 001-2- 6295234 යටතේ බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම" මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෙම ජංගම ගිණුම යටතේ රු. 750000.00 ක බැංකු අයිරා පහසුකමක් අත්‍යාවශ්‍ය ගෙවීම් කිහිපයක් කිරීමට සහා ආවරණ අනුමැතියට යටත්ව ලබා දෙන මෙන් ඉල්ලා තිබුණු අතර පහත සදහන් වන ජංගම ගිණුම ඇපයට තබාගෙන බැංකු අයිරා පහසුකම ලබා දෙන මෙන්ද ඉල්ලා තිබුණි.

| ගිණුම් අංකය | ගිණුම | ශේෂය |
|---|---|---|
| 035-1-001-6-6295883 | ජංගම ගිණුම | රු. 1698209.00 |

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

මම බැලුවා මෙය. 7 වෙනි මාසේ 31 වෙනිදට දෙලක්ෂ හතලිස් දහස් නවසිය අනු තුනක ඌණතාවයක් තියෙනවා.ඊලගට ඒක 8 වෙනි මාසේ 1 වෙනිදට ගිහිල්ලා තියෙනවා එක්ලක්ෂ අනු එක් දහස් හාරසිය අනුවයි. අනෙක් ගිණුම් බැලුවහම ඒවයෙ තියෙනවා මුදල්. පොදු අරමුදලේ තමයි මේ ප්‍රශ්ණය තියෙන්නේ. එනිසා බැංකු අයිරාවක් නොගෙන පුලුවනිනේ අනෙක් ගිණුම් වලින් මේක පියවන්න.සභාවේ සල්ලි ගිණුම් වල තියෙද්දි බැංකු අයිරා ගෙවන්න අවශ්‍ය නැනේ.

ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඉතින් ඔබතුමා උප සභාපති ලෙස හිටපු කාලෙත් බැංකු අයිරා ගෙව්වනේ. 1997 දී බැංකු අයිරාව ලක්ෂ 08ක්. මෙහෙමයි තියෙනවා අනෙක් ගිණුම් වල මුදල්. නමුත් ඒ ගිණුම් වල මුදල් මාරු කරන්න බැහැ.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

බැංකු අයිරා ගෙවන එක ආයතනයකට හොද දෙයක් නෙවෙයි. එනිසා මේක අඩු කර ගන්න බලන්න.ආදායමට වඩා දැන් වියදම වැඩි නිසා අනිවාර්යෙන්ම මේක බැංකු අයිරා ගෙවන්න වෙනවා.ලයිට් බිල් වතුර බිල් සේවක පඩි අතිකාල දීමනා ආදිය අනිවාර්යෙන්ම ගෙවිය යුතුයි. එනිසා අපි මෙය සීමා කරගත යුතුයි. අපි මේක අනුමත කරන්න කරන්න දිගටම මේක මෙහෙම යනවා. එනිසා මෙය අවම කරගන්න. මේ වතාවෙදි අපි අනුමැතිය දෙනවා. ඊලග එකේදි මේක අඩු කරගන්න.

ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මන්ත්‍රීවරුන් විරුද්ධද මෙයට.

තීරණය

- **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් 035-1-001-6-6295883 යන බැංකු ගිණුම ඇපයට තබා බැංකු අයිරා පහසුකමක් ලබා ගැනීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** 2014 වර්ෂයේ ජුනි සහ අගෝස්තු මාස වලට අදාලව රු. 2276.01 ක මුදලක් බැංකු ගාස්තු ලෙස ගිණුම්ගත කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම

අම්බලන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන පොදු ගිණුම සදහා පහත පරිදි බැංකු ගාස්තු අයකර ගෙන ඇති බවත් එහි මුළු වටිනාකම වන රු. 2276.01 ක මුදල වියදම් වශයෙන් ගිණුම් ගත කිරීමට සභා අනුමැතිය ඉල්ලා තිබුණි.

| පොදු ගිණුම | NBT | බැංකු අයිරා පොළී | එකතුව |
|---|---|---|---|
| 2014 ජුලි | 2.24 | 191.26 | 193.50 |
| 2014 අගෝස්තු | 0 | 2082.51 | 2082.51 |
| එකතුව | 2.24 | 2273.77 | 2276.01 |

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් ජුලි මාසෙම බැංකු අයිරා තිබිලා තියෙන්නේ රු.191.26 . අගෝස්තු මාසේ තිබිලා තියෙන්නේ රු.2082.51 යි. විශාල මුදලක් බැංකු අයිරා ලෙස නැහැ.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් බැංකු ගාස්තු ගිණුම්ගත කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** නො 23/73 L චින්තක උයන,පැට්වත්ත, වතුගෙදර ලිපිනයේ පදිංචි එච්. සුසන්ත ද සිල්වා මහතාට පාට කොඩි කණු 50 ක් සහා ආවරණ අනුමැතියට යටත්ව නොමිලයේ ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා ගැනීම.

උපහාර උළෙලක් වෙනුවෙන් පාට කොඩි 50ක් 2014.09.22 දිනට නොමිලයේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ග්‍රේෂන් කෙරම්ණිය මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව තමයි මේක ලබා දීලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්**

පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත විද්‍යාලයේ නව දියුණුවේ නව නිර්මාපක සමන් චන්දන විදුහල්පතිවරයාට උපහාර කිරීමක් වශයෙන් ප්‍රදේශවාසින් හා ආදි ශිෂ්‍යයින් එකතුවෙලා උපහාර උළෙලක් පැවැත්වුවා. එම උළෙළට තමයි කොඩි කණු ටික ලබා ගත්තේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි මමත් මීට පෙර අවස්ථාවක ඔය පාට කොඩි ඉල්ලුවා. නමුත් මට ලබා දුන්නෑ. ඒවා තියෙන්නේ සභාවේ වැඩ වලට විතරයි කීවා. එලියේ තිබ්බ කොඩි 5 හෝ 10 ක් මම අරගෙන ගියා.මෙතන 50 ක්ම දීලා. මම හිතනවා මේ ආකාරයට දෙවිදියකට සැලකීම සාධාරණ නෑ කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පොල්වත්ත විදුහලේ විදුහල්පතිතුමාගේ උපහාර උළෙලකට මේ දුන්නේ. ඒක ලිඛිතව ඉල්ලා තියෙනවා. ඔනම මන්ත්‍රී කෙනෙක්ට එහෙම අවශ්‍ය නම් ලිඛිතව ඉල්ලීමක් කරන්න. එවිට අපට පුලුවන් ලබා දෙන්න. නමුත් මුදල් නිදහස් කිරීම මට වත් ලේකම් මහත්තයාට වත් කරන්න බෑ. ඒක කරන්න පුලුවන් මේ සභාවට විතරයි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි ඇත්තටම මේ මන්ත්‍රී කෙනෙකුට නැද්ද බලයක් කොඩි කණු ටිකක් නිදහස් කිරීමට.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීකෙනෙකුට වගකීමක් ගන්න පුලුවන් ඇප මුදල පිළිබඳ විතරයි.මුදල් නිදහස් කිරීමට බලයක් සභාපතිතුමාටවත් නෑ. ඒ බලය තියෙන්නේ සමස්ථ සභාවටම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

දැන් සිකුරාදා වගේ දවසක කවුරු හරි අපෙන් කොඩි කණු ටිකක් අරන් දෙන්න කියලා ඉල්ලා සිටියොත් කරන්න විදියක් නැති වෙනවනේ. දැන් ළමයි ඇවිත් ක්‍රීඩා උත්සව වලට කොඩි කණු අරන් ඉල්ලනවා. ඉතින් ඒ දේවල් කරදෙන්න බැරි වුණහම අපි අපහසුතාවයට පත් වෙනවනේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි රු. 10 ක් වැනි ඉතාම සුලු මුදලක් අය කරන්නේ. ඇත්තටම අපි ප්ලාස්ටික් පුටුවක් දෙන්නෙත් රු.5 කට.අපෙන් රු.5 ට පුටු අරන් ගිහින් වැඩි මුදලකට බදු දෙන අය ඉන්නවා. ග්‍රේෂන් මන්ත්‍රීතුමා නිවරදි ආකාරයට ඉල්ලීම කළා. එනිසා එයට අනුමැතිය ලබා දුන්නා.සභාව තීරණයක් ගන්නවා නම් කොඩි කණු අවශ්‍ය වෙලාවට මන්ත්‍රීවරුන්ට ලබා ගන්න පුලුවන් ආකාරයට ඒකේ කිසිම ගැටලුවක් නෑ.අපි පිහිටවලා තියෙන ප්‍රජා මණ්ඩල වලට ලබා දෙමු පුටු ප්‍රමාණයක්. එතකොට අදාල කොට්ඨාශයේ ප්‍රජා මණ්ඩලයේ ඒවා මෙහෙයවන්නේ අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීතුමා.එතකොට අවශ්‍ය පරිදි නොමිලේ හෝ මුදල් වලට ලබා දීමේ මෙහෙය වීම් කටයුතු කරන්න පුලුවන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ප්‍රජා මණ්ඩල වල ස්ථාන නැහැනේ සභාපතිතුමා පුටු තියාගන්න.එනිසා මම යෝජනා කරනවා මුදල් ගෙවා හෝ නොමිලයේ හො ්කොඩි කණු මන්ත්‍රීවරුන්ට ක්ෂණිකව ලබා ගැනීමට හැකි ක්‍රමයක් ඇති කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙනම් ඒක යෝජනා කරන්න

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මම යෝජනා කරනවා මුදල් ගෙවා හෝ එදිනටම ලබා ගැනීමට හැකි ක්‍රමයක් ඇති කරන්න. දැන් සෙනසුරාදා වුනොත් සභාව නැහැනේ එදාට.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් ග්‍රේෂන් මන්ත්‍රීතුමාටත් ලබා දීලා තියෙන්නේ සභා ආවරණ අනුමැතියට යටත්ව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඒක හරි සභාපතිතුමා ග්‍රේෂන් මන්ත්‍රීතුමාට කල් වෙලා තිබුණ නිසා හොදයි.මම කියන්නේ ක්ෂනිකව ලබා ගන්න ක්‍රමයක් ඇති කරන්න කියලා.මොකද ආරක්ෂක අංශයේ අයට මේ පිළිබඳ අවබෝධයක් නැනේ. ඔවුන්ට උපදෙස් ලබා දීලා තියන්න මන්ත්‍රීවරුන්ට ඕනෑම අවස්ථාවක ලබා දෙන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මෙහි සදහන් කරානම් හොදයි ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණිය මහතාගේ ඉල්ලීම පරිදි කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණිය මහතා කතා කරමින්</u>**

මේ විදුහල්පතිතුමා සමස්ථ ලංකාවේම හොදම විදුහල්පතිවරයා බවට පත් වුණා .

ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්

මමත් ඔය ආකාරයටම ලිපියක් යොමු කළා ගිය මාසේ. නමුත් ඒකට අනුමැතියක් ලැබුනේ නෑ. මම සල්ලි ගෙවලා ගත්තේ.

ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ලේකම් මහත්තයා මන්ත්‍රීවරුන්ට අයිපෑඩ් ලබා දෙන්න කියලා සාකච්ඡා වුණා හබරන තිබුණු රැස්වීමෙදි. ඔබතුමා ඒකට අවේ නැනේ. අයි පෑඩ් ගබඩාවට අරගෙන භාවිතා කිරීමේ පදනම මත මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කීවා. අයි පෑඩ් මගින් ප්‍රදේශවාසීන්ගේ කැමැත්ත විමසීමේ ක්‍රමවේදයක් සකස් කරලා තියෙනවා. ඒෂියා පවුන්ඩේෂන් ඒකේ ආධාර මත ලබා දෙන්නේ. දැනට ගාල්ල නගර සභාවේ සම්පූර්ණයෙන්ම අරන් දීලා තියෙන්නේ.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතාගේ ඉල්ලීම පරිදි සභා ආවරණ අනුමැතියට යටත්ව ලබා දෙන ලද පාට කොඩි 50 වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:6** ' නගර සභා ආපන ශාලාව ටෙන්ඩර් කිරීම ' මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදි.

නගර සභා ආපන ශාලාවේ බදු ගිවිසුම් කාලය 2014.10.15 දිනෙන් අවසන් වන බවත් එම නිසා එය නැවත ටෙන්ඩර් කිරීමට පහත සඳහන් ගාස්තු යෝජනා කර තිබුණි.

| | |
|---|---|
| වාර්ෂික බදු මුදල | = රු. 115000.00 |
| ටෙන්ඩර් ඇප | = රු. 5000.00 |
| ටෙන්ඩර් පෝරම ගාස්තු | = රු. 500.00 |

මේ සඳහා රජයේ අනෙකුත් බදු මුදල් ඇතුලත් විය යුතු බවද සඳහන් කර තිබුණි.

ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ මාසේ 15 වෙනිදාවෙන් ඉවර වෙන ටෙන්ඩර් එකට අවම මුදල සභාවට ඉදිරිපත් කරන්නේ මේ අද. එතකොට ලබන මාසේ තමයි ටෙන්ඩර් එක දාන්න වෙන්නේ. දවස් 15 ක් වහලා එහෙම වුනහම.කලින් මේක දාලා අනුමත කරගන්න එපැයි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නගර සභා ආපන ශාලාව ටෙන්ඩර් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:7** පොදු වෙළඳ පොළ සාප්පු සංකීර්ණයේ උඩු මහලේ අංක 06 , ඒ. ඩබ්. එම්. අක්තාර් මහතා බදු ගෙන ඇති කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම' මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබූ ලිපිය සභාගත කිරීම.

අම්බලන්ගොඩ පොදු වෙළඳපොල සාප්පු සංකීර්ණයේ උඩු මහලේ අංක 06 දරණ කඩ කාමරය 2014.08.22 වන දින මුදා තැබීම හේතුවෙන් නැවත මෙම කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා පහත පරිදි ගාස්තු අය කිරීම යෝජනා කර තිබුණි.

| | |
|---|---|
| මාසික කුලිය | = රු. 3440.00 |
| අවම එක් වන් මාසික කුලිය | = රු.344000.00 |
| ටෙන්ඩර් ඇප | = රු 5000.00 |
| ටෙන්ඩර් පෝරම ගාස්තු | = රු. 500.00 |

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් පොදු වෙළඳ පොළ සාප්පු සංකීර්ණයේ උඩු මහලේ අංක 06 කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:8** 'ධීවර වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ අංක 01 , අබ්දුල් වාරි හාජි අමීර් මහතා බදු ගෙන ඇති කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම' මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබු ලිපිය සභාගත කිරීම.

2014.08.22 වන දින අම්බලන්ගොඩ ධීවර සංකීර්ණයේ උඩු මහලේ කඩ කාමර අංක 01 කඩ කාමරය මුදා තබා ඇති හෙයින් නැවත ටෙන්ඩර් කිරීම සඳහා පහත පරිදි ගාස්තු අය කිරීම යෝජනා කර තිබුණි.

| | |
|---|---|
| මාසික කුලිය | = රු. 3250.00 |
| අවම එක් වන් මාසික කුලිය | = රු.325000.00 |
| ටෙන්ඩර් ඇප | = රු 5000.00 |
| ටෙන්ඩර් පෝරම ගාස්තු | = රු. 500.00 |

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ධීවර වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ අංක 01 කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවු වෙනත් කරුණු

**12:1** ' 2014 අගෝස්තු මස වාර්තාව ' මැයෙන් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වු දින ගණන 21 ½ ,ආයතනයට පැමිණි රෝගීන් ගණන 231, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 11, මාසය සඳහා වැය වු ඖෂධවල මුළු වටිනාකම රු.19218.57, රෝගියෙක් සඳහා වැය වු මුදල රු. 83.19 ලෙස සඳහන් කර තිබුණි.

තීරණය

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මෙම වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ලබා දෙන සන්නිවේදන දීමනාව ලබා ගැනීම' මැයෙන් අම්බලන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වෛද්‍ය එම්. පී. බී. ඩබ්. යු. කුමාරි මෙනවිය විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

දකුණු පළාත් පාලාත් පාලන කොමසාරිස්ගේ දපාපා/ගි/04 අංක දරණ 2014.07.28 දිනැති ලිපියට අනුව රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 446 හි 02 (V) වගන්තියට අදාලව ආයුර්වේද වෛද්‍යවරුන්ට ලබා දීමට නියමිත දුරකථන ගාස්තු ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ චක්‍ර ලේඛයේ ගැටලුවක් තියෙනවා.අපි මන්ත්‍රීවරුන්ට දෙන්නෙත් රු. 1500.00 යි. ආයුර්වේද වෛද්‍යවරයාට රු. 4000.00 ක් දෙනව නම් මන්ත්‍රීවරුන්ගේ දීමනාව වැඩි කරන්න ඕන නැතිනම් මේ දීමනාව අඩු කරන්න ඕන.නැතිනම් විෂමතාවයක් ඇති වෙනවා.

**තීරණය**

☛ **ලේකම්තුමාගේ සහ ගණකාධිකාරීතුමාගේ දුරකථන දීමනා සීමාවේ සිට ආයුර්වේද වෛද්‍යවරියට දුරකථන දීමනාව ලබා දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ‘ නුගේතුඩුව පලවන හරස් පාර නගර සභාවට පවරා ගැනීම සහ පාර සංවර්ධනය කර ගැනීම ’ මැයෙන් පොල්වත්ත ප්‍රජා මණ්ඩලයේ ලේකම් පී. ඩබ්. ආනන්ද මෙන්ඩිස් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පී. ඩබ්. ආනන්ද මෙන්ඩිස් , පී. ජගත් විජේනායක , වයි. එච්.ටී. වික්‍රමසිංහ ,සුරංග මදනායක යන අය අත්සන් කරමින් පොල්වත්ත ග්‍රාම සේවා වසමේ පිහිටි නුගේතුඩුව පලවන හරස් පාර නගර සභාවට පවරා ගෙන මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා තිබූ අතර නගර සභාවේ සිව් අවුරුදු සංවර්ධන සැලැස්මට අනුව පොල්වත්ත ග්‍රාමසේවා වසම යටතේ අය වැය යෝජනා ප්‍රමුඛතා ලැයිස්තුවේ අංක 03 යටතේ මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා 2014වර්ෂයට මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් 2014.08.26 දින පැවැති සංවර්ධන උපදේශන කමිටුවේදී මෙම යෝජනාව පිළිබඳ විමසීමේදී මෙම මාර්ගය නගර සභාවට පැවරීමේ කටයුතු කළ යුතු බව තාක්ෂණ සේවා නිළධාරිනිය සඳහන් කළ බවත් එබැවින් මෙම මාර්ගය නගර සභාවට පවරා ගෙන මෙම වර්ෂය තුළ මෙම මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් නුගේතුඩුව පලවන හරස් පාර නගර සභාවට පවරා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ’අම්බලන්ගොඩ පෞද්ගලික බස් රථ සංගමයේ හිතුවක්කාරී ක්‍රියා නිසා මගී ජනතාව පීඩාවට අනාරක්ෂිතභාවයට හා අනතුරට පත්කිරීම ” මැයෙන් ගිංතොට ,පියදිගම, අද්දරගෙවත්ත ලිපිනයේ පදිංචි වී. රොෂාන් පෙරේරා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ගාල්ල , මාතර ,තංගල්ල, කතරගම සිට කොළඹ දක්වා ධාවනය වන සිඝ්‍රගාමී බස් රථ මෙතෙක් අම්බලන්ගොඩ නගර මධ්‍යයේ ප්‍රධාන බස් නැවතුම්පල අසල නැවැත්වූ අතර මෑතක සිට එම නැවතුම අම්බලන්ගොඩ නගරයෙන් බැහැරට ගෙනගොස් ඇති බවත් ජාතික ගමනා ගමන කොමිෂන් සභාව , ප්‍රදේශයේ පොලීසිය, මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ආයතන මේ සම්බන්ධයෙන් නිසි සම්බන්ධීකරණයක් වී නොමැති බවත් අම්බලන්ගොඩ පෞද්ගලික බස් රථ සංගමය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී ඔවුන්ගේ බස් රථ වලට මගීන් නොනගින බව පවසමින් අනෙකුත් නගර වල සිට කොළඹ දක්වා ධාවනය වන දුරගමන් සේවා බස් රථ නැවතුම එම ස්ථානයෙන් ඉවත් නොකලහොත් බස් රථ වර්ජනයක් ක්‍රියාත්මක කරන බව පවසමින් අනෙකුත් ආයතන බිය වද්දමින් මෙය අත්තනෝමතිකව ලබා ගත් තීරණයක් බව දැනගන්නට ලැබුණු බවත් මෙම හේතුවෙන් මගී ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වන බවත් සඳහන් කර තිබූ අතර මේ පිළිබඳ ජනතා අප්‍රසාදය එල්ල වන බැවින් කලින් තිබූ ස්ථානයේම බස් නැවතුම්පල ස්ථාපනය කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් මම සඳහන් කරන්න ඕන දුර ගමන් සේවා නැවතුම කියලා බෝඩ් 2 ක් දාලා තිබුණා සෙලාන් බැංකුව ඉස්සරහ. පාසල් යන ළමුන්ට ඒක විශාල ගැටලුවක් වෙලා තිබුණා. එනිසා මම ඒ බෝඩ් 2ක නගර සභාවට ගලවගෙන ආවා.ඇත්තටම අපෙන් විමසීමකින් තොරවයි මේ වෙනස් කිරීම කරලා තියෙන්නේ. ගලවගෙන ඇවිල්ලා දවස් 2ක් යන කොට ආපහු බෝඩ් 2 ක් ගහලා තිබුණා.ඒ බෝඩුත් ගලවන් එන්න කිව්වා. කලින් දුර ගමන් සේවා නැවැත්තුව ස්ථානයේ රථ වාහන නැවැත්වීම තහනම් ඇල්පිටිය පොලිස් අධිකාරී කියලා බෝඩ් එකක් තිබුණා. ඒකත් ගලවන් එන්න කිව්වා.මොකද

ඇල්පිටිය පොලිස් අධිකාරීටවත් මාර්ග සංවර්ධන අධිකාරියටවත් නැවතුම් ස්ථාන නම් කිරීමේ බලයක් නෑ. ඒක කරන්න පුලුවන් අදාල පළාත් පාලන ආයතනයට විතරයි. ඇත්තටම මෙය ධර්මාශෝක විදුහලට දේවානන්ද විදුහලට වගේම නගර සභාවට එන අයටත් විශාල ගැටලුවක් වෙලා තියෙනවා. මම පොලිසියට කීවා.පොලිසිය කලින් දීප්ති මල් ශාලාව ළඟ නවත්වන වාහන ලිව්වා. නමුත් ඔවුන් දැන් ලියන්නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මීට වඩා බරපතල තත්වයක් මෙතන තියෙනවා සභාපතිතුමණි.කීප දෙනෙක්ම මට දොස් කීවා මේකට.මෙතන වැස්සට තෙමෙනවා. ඒ වගේම බාර් දෙකක් තියෙනවා. ගැහැණු අයට මෙතන තනිවම ඉන්න වෙන අවස්ථා තියෙනව.බීලා එන මිනිස්සු කාන්තාවන්ට එක එන ඒවා කියනවා. විාල කාන්තාවන් ප්‍රමාණයක් මෙතනින් බස් එකට නගිනවා.කීප දෙනෙක් මට කීවා නගර සභාවක් තියෙන්නේ මේකටද කියලා. ඉතින් මම කීවා මේක අපි කරපු දෙයක් නෙවේ කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

විපක්ෂ නායකතුමා මේක පොලිසියවත් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියවත් මේක කරලා නෑ.මට පේන්නේ මේක පෞද්ගලික බස් රථ හිමියන් කරපු දෙයක්. ඇල්පිටියේ පොලිසියේ එස්.එස්. පී. මහත්මයා මාසෙකට සැරයක් රැස්වීමක් තියනවා. මේ රැස්වීමට අපේ නිළධාරියෙක් යනවා. එතනදී ඉල්ලීමක් කරලා තියෙනවා මොවුන්. අපි ගලවපු බෝඩ් එක දෙවෙනි පාර ගහලා තියෙන්නේ RDA එකෙන්. එවුන්ට කිසිම අයිතියක් නෑ හෝල්ට් පිහිටුවන්න.එකට දුර ගමන් සේවා සඳහා ජාතික කොමිෂන් සභාව තියෙනවා. තව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය තියෙනවා.නමුත් මොවුන්ටත් අපේ අනුමැතිය නැතිව නැවතුම් ස්ථාන පිහිටවන්න බෑ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේ ලිපිය ඉදිරිපත් නොවුනත් මම මේ ගැන කතා කරන්න හිටියේ.මෙතන බස් නැවතුවහම මෙතනින් මහ විදියට යන්නත් බෑ.මිනිස්සුන්ට පාර හරහා යන්න බෑ.මෙය ඉතාමත් අනතුරුදායකයි.සමහර අය කීවා මෙය පිලිබඳ පැමිණිලි කරනවා කියලා.මේ පවතින ගැටලුකාරී තත්වයන් සැලකිල්ලට ගෙන කලින් තිබූ තැනම නැවතුම්පලවල් පිහිටවන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමා මෙහි පවතින බරපතලම ගැටලුව වෙන්නේ සාමාන්‍ය බස් රථයක ගමන් කරන දුප්පත් මිනිස්සු දරුවෝ බෑග් මලු ඔක්කොම උස්සගෙන මෙතනට පයින් එන්න ඕන. සමහරක් විට ඔවුන් මේ පළාත දන්නෑ. මොකද මොවුන් පිට මිනිස්සු. ඉතින් විශාල ගැටලුවක් මේ ආකාරයෙන් කොළඹ බස් රථ නැවතුම් ස්ථානය එකවර වෙනස් කිරීම. මෙතන නැත්තේ සංවරය. බස් ස්ටෑන්ඩ් එකෙන් එන ඒවයි හැම එකක්ම එකවර දානවා. අපි හිතුවේ නෑ මෙය නිත්‍යානුකූල තත්වයක් කියලා. අපි හිතුවෙ බසු රථ හිමියන්ගේ හිතුමතේට මෙය කරනවා කියලා.දැන් බලනකොට නීත්‍යානුකූලවම අවසරය ලැබිලා තියෙනවනේ බස් රථ හිමියන්ට මෙතැන නවත්තන්න.මගියෝ හරිම අසරණ වෙනවා.අනුරාධපුර සහ වව්නියා කෝච්චියට එන මිනිස්සු ඉන්නවා.දැන් මෙතන මේ මිනිස්සු බැස්සුවහම කරකවලා අතහැරියා වගේ . මගෙන්ම කීප දෙනෙක් අහලා තියෙනවා කොහොමද බස් නැවතුම්පලට යන්නේ දුම්රිය නැවතුම්පලට යන්නේ කොතනද කොළඹ බස් නවත්තන්නේ කියලා. සෙලාන් හන්දිය කියන්නෙත් බස් නවත්තන්න සුදුසු තැනක් නෙවෙයිනේ. එතන ර්ට වඩා රථ වාහන තදබදයනේ.බස් අතර තියෙන තරගකාරීත්වයට අපි මගී ජනතාව පරදුවට තියන්න ඕන නෑනේ සභාපතිතුමා.දීප්ති එක ලග බස් නවත්තලා සෙනග ගන්න කියන්න. පොලිසියටත් මේ බව දන්වන්න. මෙතන තද බදයක් පවතින බව ඇත්ත.දීප්ති එක ලග නවත්වනවා නම් තදබදය නවතිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ඔය කියන කතාව සත්‍යයක් සභාපතිතුමණි. මොකද මමත් දවසක් ගාලු ගිහිල්ලා එන කොට අම්බලන්ගොඩ බහින්න කියලා කෑ ගැහුවා. එතකොටයි මමත් දන්නේ මෙතනය බස් නවත්තන්නේ කියලා.කලින් තැන නැවැත්තුවේ නැති වුනොත් කොළඹටම යන්න වෙන නිසා ඉතින් එතනින් බැස්සා.එදා මම තේරුම් ගත්තා එකේ දැඩි අපහසුතාවයක් තියෙනවා.දැන් බැලුවහම අපටනම් බලතල තියෙන්නේ ඇයි අපි ඒ බලතල අනෙක් අයට දීලා නිහඬව බලන් ඉන්නේ. ඒ බෝඩ් ගලවගෙන ඒමට ඔබතුමා ගත්ත ක්‍රියා මාර්ගය ඉතාම ප්‍රසංසණීයයි. මම සතුටු වනවා ඔබතුමා නොබියව එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධයෙන්. ඇත්තටම මෙතන තියෙන්නේ වෙන අභ්‍යන්තර ගැටලුවක් ඔබතුමා සදහන් කළා වගේ. තමන්ට ලෝඩ් එක නැති වෙනවා කියන අදහස මෙතන තියෙන්නේ. එනිසා මෙතන බස් රථ නැවැත්තීම තහනම් කියලා අපි බෝඩ් එකක් ගහමු. මොකද අපි මගී ජනතාවගේ පහසුවයි සලසන්න ඕන.

තීරණය

☞ **නගර සභාවේ අනුමැතියකින් තොරව දුර ගමන් සේවා නැවතුම් ස්ථාන වෙන්ස් කර ඇති බව සඳහන් කළ ගරු සභාව" දුර ගමන් සේවා නැවතුම් ස්ථානය- අණපරිදි සභාපති නගර සභාව අම්බලන්ගොඩ" ලෙස සඳහන් කළ දැන්වීම් පුවරුවක් පෙරදී දුර ගමන් සේවා නැවතුම පැවති ස්ථානයේ සවි කරන ලෙස තාක්ෂණ සේවා නිළධාරිනියව දැනුවත් කරන ලෙස සඳහන් කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමණි මෙහිදී පොදු වෙළඳ පොල අසල තියෙන ටවර් හන්දිය පිළිබඳවත් අවදානය යොමු කරන්න. මොකද වංගුවත් එක්ක ත්‍රීවිල් ගහලා තියෙනවා

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් අලුත් මාර්කට් එක ආවහම පාර කොනට ගෙනියන්න කියලා ඉන්නේ. දැන් මැදින් එන පාර කොනට දාලා සම්පූර්ණම එක බිල්ඩිමක් ගහන්න කියලා හදන්නේ. එතකොට යම් වෙනසක් ඇති වෙයි

.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ඒක නිවරදී සභාපතිතුමණි. ඒත් එක්කම ඔය වංගුවෙ ත්‍රීරෝද රථ සහ පොදු වාහන නවත්තලා තියෙනවා. අඩුම ගානේ මං සන්ධිය ආසන්නයේ මීටර් 50 ක් යනකම් වත් වාහන නැවතීම තහනම් කරන්න කියලා ඉල්ලා සිටිනවා .

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය කිරීමට අපහසුයි.ප්‍රායෝගිකව අපහසුයි. මීටර 50 ක් අයින් කර ගමන් කොච්චර ඈතට යනවද හිතන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

පරණ ටවර් එක පාරේ මේ අතට ත්‍රීවිල් 3 ක් නවත්තලා තියෙනවා.පොඩි කෙසෙල් කඩේ ඉස්සරහත් වාහන කාර් නවත්තලා තියෙනවා කිසිම අවබෝධයකින් තොරව.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

50 ක් නෙවෙයි එහෙනම් මීටර් 30 ක් විතර 25ක් වගේ ප්‍රමාණයක් අයින් කරමු. නමුත් එතකොට වෙන්නේ මාලු කාරයා ඇවිල්ලා මාලු ලැල්ල කතියනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

නීතිය බලාත්මක කිරීමේ අයිතිය තියෙන්නේ අපටනම් අපි එය ක්‍රියාත්මක කරමු සභාපතිතුමා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මේක පොලිසියට කියමු.පොලිසිය එන රැස්වීමට මන්ත්‍රීවරු එන්න. එතනදී ඔය ප්‍රශ්න කතා කරන්න පුලුවන්.පොලිසිය හැමදාම එනවා. පසු ගිය දවස් වල අපි කතා කලා කසල අනිසි ලෙස බැහැර කරන අයට නඩු පවරන්න කියලා. ඔවුන් එය ඉටු කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

සභාපතිතුමා අපි ඉල්ලීමක් කළා පොළ ගාව වන් වේ වේලාව සඳහන් කරන්න කියලා.නමුත් තවම එය ක්‍රියාත්මක වෙලා නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එන් වේ කරපු නාම පුවරු ගහපු එකේ පොළගාව එකෙයි නගර සභාව ගාව එකෙයි වේලාව සඳහන් කරලා නෑ.එන් වේ කරන වේලාව සඳහන් කරලා බෝඩ් එක ගහන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිණී මේනුකා විජේසූරිය මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමණි විශේෂයෙන්ම කියන්න ඕන දුම්රිය පොළ පාරේ තියෙන රථ වාහන තද බදය. මෙතන ඇත්තටම තියෙන්නේ පිටින් එන ත්‍රිවිල්. ඇත්තටම අම්බලන්ගොඩ තියෙන ත්‍රිවිල් එකක් ගහලා තියෙනවනම් කමකුත් නෑ.ඇත්තටම බඩුවක් ගන්න ඇවිල්ලා කෙනෙකුට වාහනයක් වත් නවතන්න බෑ.පොලිසියත් එක්ක සහ ව්‍යාපාරික ප්‍රජාවත් එක්ක කතා කරලා පුලුවන් ඉකිමනින් මේ සදහා පිලියමක් යොදන්න කියලා මම යෝජනා කර සිටිනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔතන වුම්රිය පොල පාරේ ත්‍රිවිල් ගහන එක ඇත්තටම කරන්න පුලුවන් එක පොඩි තැනක විතරයි.උපරිම ත්‍රිවිල් තුනයි. අනෙක් තැන් වල ත්‍රිවිල් නවතන එක වැරදියි.පොලිසියට අපි කියලා තියෙනවා. නමුත් ක්‍රියාත්මක වෙනවා අඩුයි.

12:5 ‘ අම්බලන්ගොඩ බස්නැවතුම්පල පොදු වැසිකිළය බදු දීම ’ මැයෙන් විෂය ලිපිකරු විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ බසුනැවතුම්පල පොදු වැසිකිලියේ බදු ගිවිසුම් කාලය 2014.12.31 න් අවසන් වන බවත් 2015 වසර සඳහා බදු දීමට මාසික බදු කුලිය රු. 7850.00 ක් ලෙස අය කිරීම සුදුසු බව සඳහන් කර තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් අම්බලන්ගොඩ බස්නැවතුම්පළ පොදු වැසිකිලිය බදු දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී කේ. පුෂ්පික ඉන්දජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමණි ගිය සභාවෙදි මම සඳහන් කළා කැපුවල කාණුව පිළිබඳව. නමුත් කිසිම කෙනෙක් ආවේ නෑ ඕක බලන්න. මේ පාර වැස්සට ගෙවල් කීපයක්ම යට වුණා වතුරට.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණ සේවා නිළධාරී මෙය පරික්ෂා කරලා බලන්න

12.6 ‘ ව්‍යාජ මුදල් හඳුනා ගැනිමේ යන්ත්‍රයක් ලබා ගැනීම ’ මැයෙන් සරප් විසින් ඉදිරිපත් කර තිබු ලපිය සභාගත කරන ලදී

අම්බලන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාජ මුදල් භාවිතා වන බවට ආරංචි මාර්ග මගින් දැන ගන්නට ලැබුණු බවත් සරප් රාජකාරී කටයුතු කිරීමේදී පිටතින් ලැබෙන මුදල් පියවි ඇසින් බලා හඳුනා ගැනීමට නොහැකි බවත් සඳහන් කරමින් ව්‍යාජ මුදල් හඳුනාගැනිමේ යන්ත්‍රයක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් මිල ගණන් කැඳවීම් කර ව්‍යාජ මුදල් හඳුනා ගැනීමේ යන්ත්‍රයක් ලබා දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ‘ පුටු 250ක් ලබා ගැනීම සඳහා ’ මැයෙන් මහ අම්බලන්ගොඩ ග්‍රාමීය වැඩි හිබටි නිවාසයේ ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ වැඩි හිටි සංගමය මගින් ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීවසැම වර්ෂයකම වැඩිහිටි උත්සවයක් පවත්වන බවත් මෙවර එම උත්සවය අම්බලන්ගොඩ හිරේවත්ත සිරි විජයාරාමයේදී පැවැත්වෙන බවත් ඒ සඳහා නොමිලයේ පුටු 250ක් ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් අම්බලන්ගොඩ ග්‍රාමීය වැඩිහිටි නිවාසයට නොමිලයේ පුටු 250ක් ලබා දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.8 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 1, ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ වැඩසටහන 1 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:9** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 2 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ වැඩසටහන 2 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12;10** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 3 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ වැඩසටහන 3 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:11** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 5 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ වැඩසටහන 5 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජ්.පී. ලක්මි හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:12** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 6 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ වැඩසටහන 6 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:13** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම - විවිධ ගිණුම ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ විවිධ ගිණුමෙ හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජ්.පී. ලක්මි හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:14** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම - පොදු ගිණුම වෙනත් ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අගෝස්තු මාසයේ පොදු ගිණුමෙ වෙනත් හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම ගිණුම් වාර්තාව පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**12:15** ' ආදායම් හිග ශේෂ වාර්තා 2013/2014' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජූලි සිට අගෝස්තු මස දක්වා අම් /නස / 02 / 04 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:16** ' ආදායම් හිග ශේෂ වාර්තා 2013/2014' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජූලි සිට අගෝස්තු මස දක්වා අම් /නස / 02 / 05 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් .අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:17** ' ආදායම් හිග ශේෂ වාර්තා වරිපනම් 2013/2014' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජූලි සිට අගෝස්තු මස දක්වා අම් /නස / 02 / 02 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12.18** ' ආදායම් හිග ශේෂ වාර්තා වරිපනම් 2013/2014' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජූලි සිට අගෝස්තු මස දක්වා අම් /නස / 02 / 06 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු එච්.එල් .අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:19** ' ආදායම් හිග ශේෂ වාර්තා වර්පනම් 2013/2014' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබු ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජුලි සිට අගෝස්තු මස දක්වා අම් /නස / 02 / 03 විෂයට අදාළ අය ශිර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

තීරණය

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු ඒ.පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:20** ' අම්බලන්ගොඩ පුංචි පොලෙන් බැහැර කරන කුණු සම්බන්දයෙන් ' මැයෙන් අම්බලන්ගොඩ පුංචි ලොප පාලනය කරන ලංකා කුසුමලතා විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පුංචි පොලෙන් බැහැර වන කැලි කසල රැස්කිරීම සම්බන්ධ වගකීම තමන් භාර ගන්නා බව සඳහන් කරමින් එය නිසි පරිදි ට්‍රැක්ටරයෙන් ඉවත් කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබු අතර පාර දෙපස වෙළදාම් කරන වෙලදුන් සම්බන්ධයෙන් වගකීම තමන්ට භාර ගත නොහැකි බවද සදහන් කර තිබුණි.

තීරණය

☛ **වැරදි ලෙස කසල බැහැර කරන ඕනෑම පුද්ගලයකුට එරෙහිව නඩු පැවරීමට සභාව තීරණය කරන ලදී.**

**12:21** ' THW නිවාස සඳහා එප්පු ලබා දීමේ විරෝධතා' මැයෙන් ප්‍රධාන ආදායම් කළමණාකරන සහකාර විසින් ඉදිරිපත් කර තිබු ලිපි ගොනුව සභාගත කරන ලදී.

THW නිවාස සඳහා ඔප්පු ලබා දීමට අදාල නාම ලේඛණය ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරුව ලැබී ඇති විරෝධතා සඳහා පරීක්ෂණයක් පැවැත්වීම සුදුසු බවත් ඒ සඳහා විරෝධතා මණ්ඩලයක් පත් කර ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණි.

තීරණය

☛ **THW නිවාස සඳහා ඔප්පු ලබා දීමට අදාලව ලැබී ඇති විරෝධතා විමසීම සඳහා විරෝධතා කමිටුවක් පත් කිරීමට ගරු සභාව තීරණය කළ අතර එම විරෝධතා කමිටුව සඳහා ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා ගරු නගර නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී කේ . පුෂ්පික ඉන්දජිත් මහතා පත් කිරීමටද සභාව තීරණය කරන ලදී.**

**12:22** 'SD / 2014/ 58 අංක දරණ අනු බෙදුම් අයදුම්පත සම්බන්ධවයි ' මැයෙන් ,නො.104/9 ,මහ අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි R.P.කාංචනා රුවන්ති විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

'SD / 2014/ 58 අංක දරණ අනු බෙදුම් අයදුම්පතට අදාලව අංක 2442 දරණ පිඹුරේ සඳහන්ව ඇති ඉඩම් කැබලි සඳහා විකිණීම මත අය කළ යුතු 1% ක මුදල වන රු. 32340/= ක් ගෙවීමෙන් නිදහස් කරදෙන මෙන් ඉල්ලා තිබු අතර මෙම ඉඩමෙන් හැරවුම් වෘත්තයකත් තැබිය යුතු බව සැලසුම් කමිටුව විසින් සඳහන් කළ බවත් මෙම පාර නගර සභාවට අයත් පාරක් බැවින් මෙම කොන්දේසියද ඉවත් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ආදායම් පරීක්ෂක විසින් නිර්දේශ කරලා තියෙනවා මෙම ඉඩම විකිණීමක් වෙලා නැති නිසා 1% ක ගාස්තුව නිදහස් කිරීම සුදුසුයි කියලා.ලේකම්තුමා නිර්දේශ කරලා තියෙනවා. ප්‍රධාන කළමණාකරණ සහකාර ආදායම් විසින් ඒක අනුමත කරලා තියෙනවා.ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් 1%ක මුදල නිදහස් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:23** ' 2014 වර්ෂයේ ජනවාරි 01 සිට ජුනි 30 දක්වා කාලපරිච්ජේදය සඳහා නගර සභා ආඥාපනතේ 181 (1) උප වගන්තිය ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද අර්ධ වාර්ෂික වාර්තාව ' මැයෙන් අභ්‍යන්තර විගණන නිළධාරි විසින් ඉදිරිපත් කර තිබු ලිපි ගොනුව සභාගත කරන ලදී.

විගණකාධිපතිගේ අංක එස්එන්/පීඑල්/එෆ්/ අම්නස/පොදු/2014 හා 2014.09.15 දිනැති ලිපිය පරිදි 2014 වර්ෂයේ ජනවාරි 01 සිට ජුනි 30 දක්වා කාලපරිච්ජේදය සඳහා නගර සභා ආඥාපනතේ 181 (1) උප වගන්තිය ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද අර්ධ වාර්ෂික වාර්තාව සභා ගත කොට ඒ පිළිබඳ සභාව ගනු ලබන ක්‍රියා මාර්ග දන්වන ලෙස ඉල්ලා තිබු බව සඳහන් කර තිබු අතර සේවක අර්ථ සාදක අරමුදල් සඳහා ගෙවිය යුතු අධිභාර , විශ්‍රාම වැටුප් දායක මුදල් ප්‍රේෂණය නොකිරීම,නිශ්ක්‍රිය වත්කම් , දේපල ණය සඳහා ගෙවන ලද පොලිය ප්‍රතිපුර්ණය කරවා නොගැනිම , ආදායම් පරීක්ෂාව , වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම ,සේවක ණය , ආදේශක වැටුප් ගෙවීම, 1% බලපත්‍ර ගාස්තු අය නොකිරීම , සිතුම් සෙවන ඉඩම් වෙන්දේසිය යන විගණන විමසුම් සභාපතිතුමා වෙත නිකුත් කර ඇති බව සඳහන් කර තිබු අතර එම සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු යවා ඇති බවද සඳහන් කර තිබුණි.

**තීරණය**

☛ **විගණන විමසුම් වල පිළිතුරු අනුව ඉදිරි කටයුතු කිරීමට ගරු සභාව තීරණය කරන ලදී.**

**12:24** ' වැහි කබා මිලදී ගැනීමට අදාල ඇගයීම් කමිටුවේ තීරණ දැනුම් දීම ' මැයෙන් සැපයුම් නිළධාරිනිය විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

වැහි කබා මිලදී මිලදී ගැනීම සම්බන්ධ සාම්පල් පරීක්ෂා කිරීමේ ඇගයීම් කමිටුව 2014.10.02 වන දින නිළධාරින් 5 දෙනෙකුගෙන් සමන්විතව පැවැත්වු බවත් එහිදි ඉදිරිපත් වී ඇති අවම මිල ගණන් පිළිගැනීමට තීරණය වු බවත් ඒ අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගල්කිස්ස Sparkle Link (pvt) Ltd ආයතනයෙන් වැහි කබා මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සාම්පල් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් පැවැති ඇගයීම් කමිටුවේ නිර්දේශය පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:25** ‘ අඩාලව කල් තැබු රැස්වීමට පැමිණීමට නොහැකි බව දැන්වීම ’ මැයෙන් ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.09.02 දින මාසික සභාවට සහභාගී වු බවත් එදින රැස්වීම අඩාලව 2014.09.04 දිනට කල් තැබුවත් පුද්ගලික හේතුවක් මත එදින සභාවට සහභාගී වීමට නොහැකි වු බව දන්වා තිබුණි.

**<u>තීරණය</u>**

☛ ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතාගේ පෞද්ගලික නිවාඩු සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**12:26** ‘ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම ’ මැයෙන් සැපයුම් නිළධාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2015 වසර සදහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් දිනමිණ Daily News තිණකරන් යන පුවත්පත් වල පල කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ දැන්වීම් හදලා නෙවෙයිද පත්තර වලට ලබා දෙන්නේ. මෙහෙම යැව්වම ඔවුන් ඔවුන්ට අවශ්‍ය පරිදි විශාල ලෙස දැනවීම සකස් කරලා අපෙන් විශාල මුදලක් අයකරනවා. මං කියන්නේ දැන්වීම අපිම හදලා යැවුව නම් අපි දන්නවා කීයක් යනවද කියලා.

**<u>තීරණය</u>**

☛ **ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් 2015 වසර සදහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ නිවේදනය සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සකස් කර පුවත් පත් සදහා ඉදිරිපත් කිරීම සදහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජ්ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

" ප්‍රදේශයේ ජනතාවට මහත් හිසරදයක්ව පවතින නිසියාකාරව කුණු කසල බැහැර නොකරන කුණු බක්කිය ඉවත් කර ගැනීම සඳහාය " කියලා ගරු සභාපතිතුමණි එඬේරමුල්ල ගම් වාසින් විසින් ඉල්ලීමක් කරලා තියෙනවා.
මෙම ස්ථානය එඬේරමුල්ල පාරේ බෝක්කුව අලස පිහිටා ඇති බවත් එදිනෙදා ප්‍රදේශයේ ජනතාව බැහැර කරන අපද්‍රව්‍ය වලට අමතරව වෙනත් ප්‍රදේශ වලින්ද රාත්‍රී කාලයේදී බේකරි වල කුණු බිත්තර කටු මැරුණු සතුන්ගේ මළකුණු කෙසෙල් කොට ආදියද මෙම ස්ථානයට ගෙනත් දමන බවත් මෙම ස්ථානයේ කුණු නගර සභාව මගින් ඉවත් නොකරන බැවින් මුලු ප්‍රදේශයම දුර්ගන්ධයෙන් පිරී ඇති බවත් ඒවා ආහාරයට ගැනීමට පැමිණෙන සතුන් නිසා මහා මාර්ගයේ ගමන් කිරීමත් අපහසු වී ඇති බවත් විසකුරු සතුන් පැමිණීම මැසි මදුරුවන් බෝ වීම මෙන්ම ජනතාව දැඩි මානසික පීඩාවකටද ලක් වී ඇති බැවින් මෙම ප්‍රශ්නයට ස්ථිර විසදුමක් ලෙස මෙම කුණු බක්ක මෙම ස්ථානයෙන් ඉවත් කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

ඇත්තටම සභාපතිතුමා එඬේරමුල්ල අපාය පන්සල පිටිපස්සේ කුණු බැහැර කරන ස්ථානය 1991 -1992 වගේ අවුරුදු වල හදලා තියෙන්නේ මං හිතන්නේ විගන වලින් කුණු අයින් කිරීම සිදු නොවුණු නිසා. දැනට සතියට දින දෙකක් කුණු අයින් කරන නිසා මෙම කුණු බක්කි ටික අයින් කරා නම් හොඳයි කියලා.මේ ඉල්ලීම කරලා ප්‍රදේශවාසීන් 50 දෙනෙක් අත්සන් කරලා මේ ලිපිය යොමු කරලා තියෙන්නේ. පිට පළාත් වලින් එන අය තමයි මෙතන කුණු දාන්නේ. ත්‍රී විල් වලින් ගෙනල්ලා දානවා. අපි එපා කිව්වම නගර සභාවෙන් මේ බෝඩ් එකක් ගහලා තියෙන්නේ කුණු දමන ස්ථානය කියලා කියනවා. ඉතින් අපට මුකුත් කරන්න බෑ. අපේ සෞඛ්‍ය අංශයේ කුණු අදින මහත්වරුන්ටත් ඒවා ගන්න බෑ. මොකද වැස්ස නිසා ඒවා අල්ලන්නවත් බෑ.එනිසා මේක අයින් කරන එක තමයි හොඳ.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්

නගර සභාවේ කාර්ය සාධනයට ආපු නිළධාරින් පිරිසක් විසින් තමයි මෙතන ඉඩ කඩ තියෙන නිසා මෙතන මේ ඉදි කිරීම කරලා කුණු දමන්න කියලා කිව්වේ.මමත් මේ ලිපියේ තියෙන දේවල් අනුමත කරනවා.මොකද සතියකට දෙවරක් කුණු ගන්නවා වාහනයෙන් . එනිසා ගම් වාසීන්ට අවශ්‍ය නැති නම් මේක කඩා ඉවත් කිරීම සුදුසුයි.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේකට වත්කමක් වියදම් කරලා තියෙන නිසා මේක පවත්වාගෙන යාම සුදුසු ද කියලා තාක්ෂණ සේවා නිළධාරියගෙන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් වාර්තාවක් අරගන්න. මේක දැනටත් අබලන් වෙලා තියෙන්නේ.

තීරණය

☛ **එඬේරමුල්ල ප්‍රදේශයේ මෙම ස්ථානයේ කුණු බක්කිය පවත්වා ගෙන යාම සුදුසුද නුසුදුසුද යන බවට තාක්ෂණ සේවා නිළධාරියගෙන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් වාර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.**

ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්

කැලි කසල සම්බන්ධයෙන් කතා කරපු නිසා මම කියන්න කැමති මේ වන විට අම්බලන්ගොඩ එකතු වන කුණු හල් වතුර ප්‍රදේශයට බැහැර කරන නිසා මේ ප්‍රදේශයේ විශාල වශයෙන් මැස්සන් සහ මදුරුවන් බෝවෙලා තියෙනවා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි අපි දුම් ගැහුවා.තෙල් ගන්න අනුමැතිය ලබා දීලා තියෙන්නේ.නැවත දුම් ගස්සවන්නම්.

ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්

මේ ලඟදීත් පෝරඹ දානයක් තිබ්බා. මිනිස්සු කෑම නොකා ගියේ. විශාල ගැටලුවක් වෙලා මේක. එනිසා කඩිනම් විසඳුමක් ගන්න වෙනවා.සභාපතිතුමා බැරිද මේකට විකල්ප විසඳුමක් ලබා දෙන්න. වෙන ස්ථානයකට ගෙන යන්න බැරිද කසල බැහැර කරන්න.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එහෙම වුනොත් විශාල ගැටලුවක් වෙනවා. කාලයක් යද්දි ඕක නවතියි. රත්ගම මොන්රෝවියාවත්තේ කසල බැහැර කිරීම ගාල්ල නගර සභාව කරන්නේ. කෝටි 7 ගාණක් වියදම් කරලා ඒක හැදුවේ. දැන් කසල බැහැර කරන එකත් විශාල ගැටලුවක් වෙලා තියෙන්නේ ඔවුන්ටත් . ඔවුන් වැල්ලේ වල්ලන එක කරන්නේ. අපට විශාල සම්පතක් මේක තියෙන එක.

ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්

අපට බැරිද සභාපතිතුමා හල්වතුරෙන් කුණු වළලන්න.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හාරන්න බෑ එතන මඩ වගුරක්නේ.හෑරුවොත් ඒකෙත් වතුර පිරෙනවා. දැන් කුණු දාලා පස් දාලා වහනවා.

**ගරු නගර සභා මන්ත්‍රී කේ . පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා කතා කරමින්**

ආර්. ඊ. ද සිල්වා මාවතේ පාර කඩලා රෑම් එකක් දාන්න කියලා පසු ගිය සභා වාරෙකදි අනුමැතිය ලබා දුන්නා.එතන සභාපතිතුමණි බැම්මකුත් නෙවෙයි රෑම් එකකුත් නෙවෙයි වෙනමම ගොඩනැගිල්ලක් ඉදිවෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණ සේවා නිළධාරී පරික්ෂා කර බලන්න එම ස්ථානය. දැන් ඒ මිනිස්සු ඒක කැඩුවනම් හදන්න ඕන එතන.ඉක්මනින් ඉවර කරන්න කියන්න. දැන් වෙලා තියෙන්නේ මන්ත්‍රීතුමා නගර සභාවෙන් භූමියේ පිහිටීම සැලකිල්ලට නොගෙනයි මේ අයට ඉඩමට යන්න පාර දීලා තියෙන්නේ වසර 30 -40 කලින්. දැන් මේ අයට ඉඩමට යන්න පාරක් නැති නිසා තමයි සභාවේ අනුමත කරලා ඕක හදාගන්න දුන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී කේ . පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා කතා කරමින්**

ඔය විදියට බැලුවොත් දැන් රිට එහා පැත්තේ අය ඉල්ලුවත් දෙන්න වෙනවනේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනෙක් අයට පාරවල් තියෙනවනේ .

**ගරු නගර සභා මන්ත්‍රී කේ . පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා කතා කරමින්**

බැම්ම කඩලා එහාට කරලා දැන් ඔය කඩයක් වගේ එකක් හදන්නේ.එහෙම බැලුවොත් පන්සල ළගට වෙනකම්ම අය ඉල්ලුවොත් දෙන්න වෙනවනේ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමණි ගිය වර සභාවෙදි 12.1 යටතේ තවයි දහම් පාසල් සම්බන්ධ කරුණ සාකච්ඡා කරලා තියෙන්නේ.අපි එතන සභාවෙන් යෝජනාවක් සම්මත කළා. යෝජනාවක් සම්මත වුණ ආකාරයට නෙවෙයි තියෙන්නේ. මේක සභාවේ සම්මත වුණාය කියන එක වැදගත් මොකද මං දැක්කා දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරලා තියෙනවා මේ සම්බන්ධයෙන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභා වාර්තාවේ සදහන් කරලා තියෙනවනේ සමස්ථ සාකච්ඡාවක් කැදවන්න කියලා. ඒ සාකච්ඡාව ලබන සභාවට පෙර කැදවන්න.

**තීරණය**

☛ **2014 සැප්තැම්බර් මස මාසික සභාවේදී සභා තීරණ අංක 12.1 යටතේ ඉරිදා දින පුද්ගලික පන්ති පැවැත්වීම නතර කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සමස්ථ සාකච්ඡාවක් කැදවීමට තීරණය කරන ලදී. එම සාකච්ඡාව 2014 නොවැම්බර් මස මාසික සභාවට පෙර කැදවීමට ගරු සභාව නැවතත් තීරනය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මානිමුල්ල වට රවුම් පාරේ අනවසර සර්විස් සෙන්ටර් එකක් පටන් අරන් තියෙනවා. ඒක මිනිස්සුන්ට හිරිහැරයි කියලා කිප දෙනෙක්ම මට කිව්වා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මහජන සෞඛ්‍ය පරීකෂකතුමාට කියන්න මේ ගැන හොයලා බලන්න කියලා.

තීරණය

☞ **මානිමුල්ල වට රවුම් ප්‍රදේශයේ පවත්වා ගෙන යන සර්විස් සෙන්ටර් එක පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් වාර්ථාවක් ලබා ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ තනායම සම්බන්ධයෙන් යථා තත්වය කුමක්ද කියලා දැන ගන්න කැමති සභාපතිතුමා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගිවිසුම් අත්සන් කරලා තියෙනවා. ඔවුන් වැඩ ආරම්භ කරන්න ඕන. සැලසුම් සම්බන්ධයෙන් අපෙන් තාම ඉල්ලීමක් කරලා නෑ.අම්බලන්ගොඩ තානායම හදන්න අපිත් එක්ක සැලසුම් හදපු කම්පැණි එකට දැනුම් දෙන්න තවත් පරක්කු නොකර ඉක්මණින් වැඩ ආරම්භ කරන්න කියලා.කෙහොම වුනත් දෙසැම්බර් මාසේ ඉදන් ඔවුන් බදු ගෙවන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

තල්ගස්ගොඩ ජාතික නිවාස වල සෝමලතා මහත්මිය කියලා ... මේක සභාවට යොමු වෙච්ච කාරණයක්. පරීක්ෂණයකුත් කරලා තියෙනවා මේ සම්බන්ධයෙන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වතුර බහින ගැටලුව සම්බන්ධයෙන් නේද මන්ත්‍රීතුමා. අපි ඒක සමත කරන්න දෙපාර්ශවය කැදවන්න ඉන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

ගාලු පාර දෙපස ඉවුරු වලට පස් දාලා තලලා නෑ.ඒක අපට අයිති දෙයක් නෙවේ. නමුත් ඒක ඉටුකරන්න ඕන.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මාර්ග සංවර්ධන අධිකාරියට දන්වන්න.

තීරණය

☞ **ගාලු පාර දෙපස ඉවුරු ඛාදනය වී ඇති බැවින් පස් දමා තලා සකස් කරදෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

තල්ගස්ගොඩ පාර ගිලා බැසීම සම්බන්ධයෙන් මිනිස්සු කියන නිසා මමත් බයිසිකලය දාලා බැලුවා. ඇත්තටම පෙරලෙනවා. ලොකු අනතුරක් වෙන්න පුලුවන්. අනතුරු කීපයක්ම වෙලත් තියෙනවා. අගල් 4-6 විතර නෙරුවක් පාර මැද්දේ තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වන්න අනතුරු දායක තත්වය මග හැරලා දෙන්න කියලා.

තීරණය

☞ **අම්බලන්ගොඩ බටපොල මාර්ගයේ තල්ගස්ගොඩ ප්‍රදේශයේ මාර්ගය ගිලා බැසීම නිසා ඇති වී ඇති අනතුරුදායක තත්වය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා එම අනතුරුදායක තත්වය ප්‍රතිසංස්කරණය කර ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ජේ. අයි. ද සිල්වා කියලා කෙනෙක් මට ලිපියක් එවලා තියෙනවා.

අම්බලන්ගොඩ නගරය සම්බන්ධයෙන් 2013 අප්‍රේල් මස 02 දින දාතමයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධවයි කියලා. මෙම ලිපිය නගර වාසීන් තිස් ගණනකගේ අත්සන් සහිතව ලේකම්වරයා වෙත ලිපියක් ඉදිරිපත් කරත් එයට මෙතෙක් පිළිතුරක් නැති බව සදහන් කරලා තියෙනවා. නගරයේ පාරවල් පළල් වී නගරය සංවර්ධනය විය යුතු සැලැස්ම ඇති කොට කොළඹ හම්බන්තොට පාරේ උතුරු මායිමේ සිට ලංකා බැංකුව ඉදිරිපස අධිවේගී මාර්ගයේ පිවිසුම වන ඇල්පිටිය මාර්ගය පටන් ගන්නා ස්ථානය දක්වා හම්බන්තොට පාර අඩි 100 වනසේද එතැන් පටන් දකුණු මායිම දක්වා ඇති කෙටි දුර දැනට ගොඩනැගිලි ඉදිකරීමට දී ඇති සීමාව වන අඩි 60 සීමාව නගර සැලැස්මක් ඇති කොට ඒ මත රේඛා මගින් වීදි රේඛා ඉරි මගින් සලකුණු කොට රාජකාරි කටයුතු සඳහා නගර සභා කාර්යාලයේ භාවිතා කිරීමට සලස්වා නගරයේ හා රටේ සංවර්ධනයත් ඇති කොට අල්ලස හා දූෂණය නැති කිරීමටත් පියවර ගන්නා මෙන් ඉල්ලා තිබුණි.

මේකේ 27 දෙනෙක් අත්සන් කරලා එවලා තියෙන්නේ.මේ අත්සන් කරලා තියෙන්නේ අලුත් පාරේ අය.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය දේ පාරට්මේන්තුවෙන් කරන්න ඕන දෙයක්.1948 පාර්ලිමේන්තු පනතක් තියෙනවා. ගාලු පාර කොළඹ ඉඳලා මොනරාගලටම වීදිසීමාව අඩි 50 කියලා

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේ තියෙන පිළිතුර මෙවුන්ට දන්වලා යවලා මොවුන් දැනුවත් කළා නම් හරි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගාලු පාර සම්බන්ධයෙන් තිරණ ගන්න බෑ අපිට. ජේම්ස් සිල්වා මහතමයාගේ කාලේ අඩි 30 කරලා තියෙනවා සභාවෙන්. එපාර මාර්ග සංවර්ධන අධිකාරියෙන් අපට ලියුමක් එවුවා අඩි 30 -50 අතර වන්දි ගෙවන්නේ නගර සභාවද මාර්ග සංවජ්ධන අධිකාරියද කියලා දන්වලා එවන්න කියලා. මං ඒ ලිපිය සභා ගත කළා. එදා ඉඳලා අපි සැලසුම් කමිටුවේ ප්‍රතිපත්තියක් විදියට අඩි 50 එහා කිසිම දෙයක් අනුමත කළේ නෑ. පරණ ඒවා තියෙනවා. නගර සභාව විදියට අපි මිනිස්සුන්ගේ අයිතීන් උල්ලංඝනය කරලා තියෙනවා. මොකද ඔවුන්ට වන්දි මුදල් නොලැබුණොත් කවුද වන්දි ගෙවන්නේ.විශාල ගැටලුවක් ඒක.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ජේම්ස් සිල්වා මහත්තයාගේ කාළේ වුනයි කීව දේ තනිකර නගර සභාව ගත්ත තීරණයක් නෙවේ. නාගරික සංවර්ධන අධිකාරිය මහා මාර්ග අධිකාරිය වැනි ආයතන එකතුවෙලා එදා මේ තීරණය ගත්තේ.ඇමතිවරුත් ඇවිල්ලා එදා ඒ තීරණය ගත්තේ. ඒ ගනිපු තීරණ වලට අදාල ගොනු සොයා ගන්න ඕන.සභා තීරණ අංක ඇති පොතක ලියලා . ඒක හොයා ගන්න ඕන.1985-1988 වගේ කාලේ තමයි මේක වුණේ. මේ පොත නැති වෙන්න බෑ. මොකද මම බලලා තියෙනවා මෙක යම් යම් අවස්ථා වල.එඬේරමුල්ල දේගොඩ හිගල්දූව මේ පාරවල් කරපුවා ඔක්කොම මේ පොතේ තියෙනවා.පරණ ළිං හදපුවා ප්‍රජා ශාලා හදපුවා එනකොට මේ ඉඩම ගැනත් ඒකේ සදහන් වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඇත්තටම මේ ගොනු අපි සොයා ගන්න ඕන. නැතිනම් නගර සභාවට විශාල අපවාදයක් මේක.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මම දන්න විදියට මේක මෑතකදි ගනිපු යෝජනාවක් නෙවෙයි. මම අහලා තියෙන විදියට මේ පාර සාදන අවස්ථාවේ විල්ප්‍රට් සිල්වා මහත්තයාගේ කඩේ තිබුණ කාලේ එතුමා උපසභාපති හෝ මන්ත්‍රීවරයෙක් වෙලා හිටියේ ඒ කාලේ .එතුමගේ

යෝජනාවකට තමයි මේක 60 කරලා තියෙන්නේ.අපට මතක ඇති කාලේදී අලුත් පාර හැදුවේ නැනේ. 1970 ගණන් වලනේ අලුත් පාර හැද්වේ. මේක ඒ කාලේ ආපු යෝජනාවක්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපට මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ වගේ ලිපියක් එවුවහම අපි ඇත්තටම ගැටලුවකට මුහුණ දෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මාර්ග සංවර්ධන අධිකාරිය පටන් ගන්නත් කලින් මේ යෝජනාව ආවේ. 1987 වෙනකොටත් මේක තිබුණානේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධ පාර්ලිමේන්තු පනතක් තියෙන්නේ. කලින් මේ පාර ඔප්පුවල සඳහන් වෙන්නේ අලුත් පාර කියලා නෙවෙයි. ලෂිංටන් රෝඩ් කියලා. ඒ කාලේ එහෙම වෙන්න පුලුවන්.ගැසට් එකට ගිහින් තියෙනවා අලුත් පාර. බසාර් රෝඩ් කියලා පරණ පාරත් මේ පාර අලුත් පාර කියලා වෙනමම තියෙනවා. එතකොට අපි බැඳිලා ඉන්නවා පාර්ලිමේන්තුවේ නීති වලට. අපට ඒවා ඉක්මවා යන්න බෑ.

**තීරණය**

☛ **ගාලු පාර පිළිබඳ නගර සභාවට තිරණ ගත නොහැකි බව සඳහන් කරමින් ගාලු පාර දෙපස ගොඩනැගිලි සීමාව සම්බන්ධයෙන් වන්දි ගෙවීම පිළිබඳ විමසමින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් එවන ලද ලිපියේ පිටපත් සමග 39 A , ගාලු පාර , අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ජේ. අයි. ද සිල්වා යන අයට දන්වා යැවීමට සභාව තීරණය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

විලේගොඩ ඩෙංගු රෝගීන් ඉන්නවා කියලා මිනිස්සු මට ඇවිල්ලා කිව්වා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

විපක්ෂ නායකතුමා දුමායනය සඳහා අපට ඕනෑම අවස්ථාවක ලබා දෙන්න පුලුවන් . අපි දෙන්නේ පෙට්‍රල් ලීටර 10 ඩීසල් ලීටර 10 බැටරි කැල්ලකුත් විතරයි. කෙමිකල් එක ලබා දෙන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයෙන්.එතකොට ඒ කෙමිකල් එක නිකුත් කරන්නෑ ඒ රෝගියා ඉන්නවා කියලා ඔවුන්ට වාර්තා වන තුරු.අපි මහජන සෞඛ්‍ය පරීක්ෂකට දන්වන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

ඒ වගේම තමයි සභාපතිතුමා ප්‍රජාපතිය ගාව කාණු සුද්ධ වෙන්නෑ. විශාල වශයෙන් වතුර රැඳිලා තියෙනවා. ප්‍රජාපතිය පොඩි ඉස්කෝලෙ ලගත් එහෙම තමයි. ඒ කාණුව දිගටම අපි සුද්ධ කරන්න ඕන.ඊයෙත් මට කීප දෙනෙක් කීවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔවුන්ට කියන්න දින පතා සුද්ධ කිරීමේ ක්‍රමවේදයක් අපට අනුගමනය කරන්න අපහසුය කියලා.දිගටම කරන්න අපට සේවක සංඛ්‍යාවක් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

මේ කාණු වල තියෙන තණ කොළ ටික ගලවලා දලා පිරිසිදු කළානම් හරි. මේ කාණු සමහර තැන් වල ලෙවල් නෑ. ඒකයි වතුර බහින්නැත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

පටබැඳිමුල්ලෙනුත් රෝගීන් හමුවෙලා තියෙනවා. අම්බලන්ගොඩ තවත් ප්‍රදේශ කිහිපයකින් රෝගීන් හමුවෙලා තියෙනවා.සමස්ථයක් ලෙස බැලුවම අම්බලන්ගොඩ ඩෙංගු රෝගය තියෙනවා. එනිසා අපි මේ ගැන සැලකිලිමත් විය යුතුයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ශ්‍රමදාන මට්ටමින් වත් අපි සුද්ධ කිරීමක් කරන්න ඕන.ලේකම් මහත්තයා හිරකාරයෝ හරි හමුදා නිළධාරීන් හරි යොදාගන ශ්‍රම දානයක් හරි පවත්වලා මේ ප්‍රදේශ පිරිසිදු කරන්න වැඩ සටහනක් සකස් කරන්න .

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් දිවි නැගුම වැඩ සටහන යටතේ අම්බලන්ගොඩ නගර සභාවට වෙන් කරපු ව්‍යපෘති වලදී කන්ද මාවතේ කාණුවක් අපි අනුමත කරලා දුන්නා. ඒකේ කොන්ත්‍රාත්කරු පස්ස ගහනවා. ඒක හදන්න බෑ සභාපතිතුමණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආර්ථික සංවර්ධන නිළධාරියා ඇවිත් කීවනේ ඒක පටන් අරගෙන තියෙන්නේ කියලා. එතන කඩන කෑලි ටික ලිඳ ගාව දාන්නද කියලා ඇහුවා.මම කීවා දාලා පස්සේ අදින්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

කඩනව නම් හොඳයි සභාපතිතුමණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියෙන සංවර්ධන කමිටුවේදී මේ තීරණය ගත්තා. මේකෙදි එක පැත්තක අඩි 50ක් විතර තාප්පය තියෙනවා සම්පූර්ණයෙන්ම කාණුව උඩ.කොහොමවත් හදන්න බෑ. අපට ඒකට වන්දි ඇවිල්ලත් නෑ. මම මේ කියන්න හැදුවේ කොන්ත්‍රාත්කරු කරන්නැත්නම් අපි සභාවෙන් හරි මේක කරමු කියලා. දැන් කරනවනම් ගැටලුවක් නෑනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා මානිමුල්ල ප්‍රදේශවාසියෙක් ලිපියක් යොමු කරලා තියෙනවා මාර්ගය පිලිසකර කර දෙන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

" පොදු මාර්ගය පිලිසකර කර ගැනීම " මැයෙන් නො. 42/5A මානිමුල්ල පාරේ පදිංචි බී. තරිඳු නිරොෂාන් ද සිල්වා විසින් ලිපියක් යොමු කරලා තියෙනවා.

නිවසට පිවිසෙන මාර්ගය පොදු පාරක් බවත් මෙය අඩි 3 ක් පමණ පළල බවත් වැසි දිනවල මෙම මාර්ගය සෝදා පාලුවට ලක් වන බැවින් මෙම මාර්ගය කොන්ක්‍රීට් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එතන තියෙන ළිදේ තත්වය මොකක්ද දැන්. ඒක සභාව සතු නැහැනේ. පුද්ගලික ළිඳක්නේ ඒක. ඔවුන්ට කියන්න ළිඳවත් අපට පවරන්න කියලා. මේකේ පැවරුම් නියෝගය ගේන්න කියන්න .

**<u>තීරණය</u>**

☛ **අදාල පැවරුම් නියෝගය ලබා ගැනීමෙන් පසු නගර සභාවට පවරා ගැනීමට සභාව තීරණය කරන ලදී**

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමණි කන්දේ ගොඩනැගිල්ලක් ඉදිකරන තැන ප්‍රශ්ණයක් වෙච්ච එක ආපහු බලහත් කාරයෙන් වගේ වැට ගලවලා දාලා කියලා කීප දෙනෙක් කිව්වා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණ සේවා නිළධාරී මෙය පරීක්ෂා කර බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මිනිස්සුන්ගෙන් දොස් අහන්න බැනේ සභාපතිතුමා අපට. ඒ මිනිහා හදන්නේ ඒක අල්ල ගන්නමයි. එනිසා කොන්ක්‍රීට් ටිකක් දාලා දැන්වල් ටිකක් ගහලා දාන්න. එතකොට ඉවරයිනේ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ළමා උද්‍යානයේ සවස 6 වෙනකොටම කලුවරයි. සවස 6.45 වෙනකනුත් මෙතන කට්ටිය ඉන්නවා. මෙතනට ගොඩක් ළමයිනුත් එනවා. එතන කණුවෙත් තියෙන්නේ පොඩි ළයිට් එකක්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණ සේවා නිළධාරී මමත් දැක්කා රෑ 8 ත් එතන විශාල සෙනගක් ඉන්නවා. එනිසා එතන විදුලි ආලෝකකරණය සඳහා අපට ඇස්තමේන්තුවක් ලබා දෙන්න.

**ප. ව. 12.57 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

භාරත සමරසේකර,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2014 – 10 – 20 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**